# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2412/31 - 2024 නොවැම්බර් මස 29 වැනි සිකුරාදා - 2024.11.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/COM/02/2016/182.

**කාර්මික ආරාවුල් පනත -131 වන අධිකාරය**

131 අධිකාරය වන සංශෝධිත කාර්මික අරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.06.29 දිනැති හා අංක 2077/40 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2018.06.25 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අඩිප්පල, පන්සල අසල පදිංචි කේ. ඩබ්. එන්. පෙරේරා මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 15, රොක්හවුස් පටුමග, අංක 15 හි පිහිටි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති A 37/2018 හා 2024.10.10 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජෙනරාල්.

2024 නොවැම්බර් මස 01 වැනි දින
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දී ය.

කේ. ඩබ්. එන්. පෙරේරා
පන්සල අසල,
අඩිප්පල.

(*පළමු පාර්ශ්වය*)

නඩු අංකය : ඒ 37/2018

IR/COM/02/2016/182

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
නො. 15 රොක්හවුස් පටුමග,
කොළඹ 15.

(*දෙවන පාර්ශ්වය*)

**බලතල පැවරීම**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා වෙත 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා මා වෙත බලතල පවරා දී ඇත.

**පාර්ශ්වයන් අතර උද්ගතව පවත්නා ආරාවුලේ ස්වභාවය**

මෙහි පළමු පාර්ශ්වය වන කේ. ඩබ්. එන්. පෙරේරා යන අයට වර්ෂ 2014 ජනවාරි මස 01 දිනට හිමි විය යුතු උසස්වීම දෙවන පාර්ශ්වය විසින් ලබා නොදීම තුළින් ද පළමු පාර්ශ්වය වර්ෂ 2015 ක් වූ ජුනි මස 25 දින රාජකාරි සඳහා පැමිණෙමින් සිටයදී සිදු වූ අනතුර වෙනුවෙන් හිදිසි අනතුරු නිවාඩු අනුමත නොකිරීම නිසා ඔහුගේ පෞද්ගලික නිවාඩු වලනි දින 22ක් කපා හැරීමෙන් ද ඉතිරි නිවාඩු 57ක් වැටුප් රහිත නිවාඩු ලෙස සලකා ඔහුගේ වැටුපෙන් අයකර ගැනීමෙන් ද ඒ හැරුණු විට ඔහුගේ වාර්ෂික වැටුප් වැඩිවීම අත්හිටුවාලීම තුළින් මෙම ආරාවුල් සහගත තත්ත්වය උදා වී තිබේ.

**පාර්ශ්වයන්ගේ කරුණු දැක්වීම**

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ අංක 39 දරන නියෝගය පනතේ හා 1959 මාර්තු මස 02 දිනැති හා අංක 11688 දරන *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කරන ලද 1969 කාර්මික ආරාවුල් පනතේ නියෝග සංග්‍රහයේ 21 (1) දරන නියෝගයට අනුව පාර්ශ්වයන් විසින් ආරාවුලට හේතු වී ඇති කරුණු පිළිබඳ විස්තර ප්‍රකාශයන් ඉදිරිපත් කර තිබේ. ඒවා සාරාංශ වශයෙන් ඉදිරිපත් කළ හැකිය.

**පළමු පාර්ශ්වයේ කරුණු දැක්වීම**

1. තමා 2015.06.25 දින තම මවගේ නිවසේ සිට රාත්‍රී සේවා මුරය සඳහා ගමන් කරමින් සිටින විට අනතුරකට පත් වූ බව

2. ඉන් පසුව ප්‍රතිකාර ලබා සුව වීමෙන් ඉක්බිතිව 2015.09.12 දින රාජකාරි වාර්තා කිරීම සඳහා ගිය බව

3. මෙම අනතුර සඳහා විශේෂ නිවාඩු අනුමත කිරීම සඳහා වාසස්ථානය යන අර්ථකථනයට නොවැටෙන බැවින් නිවාඩු නිවාඩු අනුමත නොකළ බව

4. එසේ නොපැමිණ සිටින කාලයට අදාළ නිවාඩු තමන්ගේ පෞද්ගලික නිවාඩුවලින් අඩුකරන ලද බව හා ඉතිරි නිවාඩු වැටුප් රහිත ලෙස සලකන ලද බව

5. මේ හේතු කොට තමාගේ උසස්වීම් අත්හිටුවන ලද බව හා තමාට හිමි වැටුප් වර්ධක ද අත්හිටුවන ලද බව

**දෙවන පාර්ශ්වයේ කරුණු දැක්වීම**

1. 2014.01.01 දිනට උසස්වීමක් ලබාදීමට කරුණු යෙදී තිබුණ ද ඔහුගේ සේවයට පැමිණීමේ දුර්වලතා සලකා උසස්වීම් ලබා දීම අත්හිටුවන ලද බව

2. දුර්වල රාජකාරි පැමිණීම පිළිබඳව අවවාද කිරීම් ලබා තිබෙන බව

3. 2015 වර්ෂය සඳහා පමණක් වැටුප් සහිත නිවාඩු 57ක් ලබා තිබෙන බව

4. මොහුට සිදු වූවා යැයි කියන අනතුරට අදාළව අනතුරු නිවාඩු අනුමත් නොකිරීමට හේතු වූයේ අනතුර සිදු වී තිබෙන ස්ථානය නියමිත ගමන් මාර්ගයෙන් බැහැර ස්ථානයක් වීම මත බව

**විසඳිය යුතු ප්‍රශ්න**

1. 2014.01.01 දිනට උසස්වීමක් ලැබීමට හිමිකම් ලබන්නේ ද

2. එය අහිමිකිරිමට බලපෑ හේතුන් කවරේද

3. ඔහුගේ රාජකාරි පැමිණීම දුර්වල තත්ත්වයක පැවතියේ ද

4. නැතහොත් 2015.06.25 දින සිදු වූවා යැයි කියන අනතුර හේතු කර පමණක් එම කාල සීමාව තුළ මොහුගේ රාජකාරි පැමිණීම දුර්වල තත්ත්වයක් පෙන්නුම් කළේද?

5. ඊට අදාළ පිළිගත හැකි වෛද්‍ය වාර්තා ඉදිරිපත් කරන ලද්දේ ද?

6. අනතුරක් සිදුව තිබේ නම් හා ඊ අදාළව පිළිගත හැකි පරිදි වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර තිබේ නම්

   i ඔහුගේ උසස්වීම අත්හිටුවීම කොතරම් දුරට සාධාරණ වේ ද?

   ii ඔහුට වැටුප් රහිත නිවාඩු අනුමත කිරීම සාධාරණ ද?

7. ඔහුගේ රාජකාරි ගමන් මාර්ගය පිළිබඳව පවත්නා වෙනස් තත්ත්වය සාධාරණ හේතුවක් මත ගෙන ඔහුට වලකා ගත නොහැකි හේතු මත උද්ගත වූවක් ද?

ඉහත දැක්වෙන ප්‍රශ්නයන්ට විසඳුම් ලබා ගැනීම තුළින් මා වෙත පැවරී ඇති කාර්යාභාරය සම්පූර්ණ කිරීම සඳහා මෙම නඩුව විභාගයට ගත යුතුව තිබිණි. එහෙත් පාර්ශ්වයන්ගේ යහපත උදෙසා කිසියම් සමතයක් පාර්ශ්වයන් අතර ඇති කර ගත හැකි වේ ද යන්න ද සලකා බලන ලදී. එහිදි ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් සමථයක් ලෙස යෝජනාවක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටියේ දින 54ක් පමණක් වැටුප් රහිත නිවාඩු ලෙස සලකන ලෙසත් ඉතිරිය තම පෞද්ගලික නිවාඩුවලින් අඩුකර ඊට අදාළ මුදල ලබා දෙන ලෙසත් තමාට අහිමි කර ඇති උසස්වීම අනෙක් හිමිකරු වෙත ලබා දෙන ලෙසත්ය. මෙම ඉල්ලීම සමතයක් වශයෙන්

ක්‍රියාවට නැගිය නොහැකි වන්නේ එහි ඇතුළත් සමහර කරුණු පිළිගත හැකි තත්ත්වයේ නොතිබීමයි. ඒ කෙසේ වෙතත් සමතය නොසලකා හරිමින් නඩුව විභාගයට ගැනීමට තීරණය කරන ලද අතර ඒ සඳහා දින ලබා දීමට කටයුතු කරන ලදී. එහෙත් එසේ නඩු විභාගයට සඳහා දින ලබා දුන් සෑම අවස්ථාවකම මෙන් පැමිණිලි පාර්ශ්වය මෙන්ම වගඋත්තර පාර්ශ්වය ද ඊට සහභාගීවීම සැලකිලිමත් ආකාරයෙන් හා වගකීමෙන් යුතුව ඉටු නොකිරීම නිසා නඩු විභාගය අවස්ථා කිහිපයකිදීම දිගින් දිගටම කල් දැමීමට සිදුවිය. මෙම නඩුව ප්‍රථමයෙන් ම විභාගය සඳහා සුදානම් කරන ලද දිනය වූයේ 2018ක් වූ ඔක්තෝබර් මස 31 දින දීය. එහෙත් දෙපාර්ශවයෙන්ම නොසැලකිලිමත් භාවයක් හේතු කර ගෙන එය 2019ක් වූ මැයි මස 14 වන දින දක්වා ම දිගින් දිගටම ප්‍රමාද කිරීමට සිදු වී තිබිණි. කෙසේ වෙතත් 2019.05.14 දින වගඋත්තර කාර පාර්ශ්වය නැවත සමථ යෝජනාවක්  ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටියේ 2015.06.25 දින අනතුර හේතු කරගෙන දින 22ක් ඔහුට හිමි නිවාඩු වලින් අඩු කර ගැනීම පිළිබඳ කිසිදු වෙනසක් සිදු නොකිරීමටත් වැටුප් රහිත ලෙස සලකන ලද දින 57 සඳහා වැටුප් ගෙවීමටත් සුදානම් බවය. මෙම යෝජනාව ලිඛිතව ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දෙන අතර ඒ සඳහා  දින ලබා දුනි. එහෙත් වග උත්තර පාර්ශ්වය තමන් ඉදිරිපත් කරනවා යැයි එකග වූ සමතය ක්‍රමවත් ලෙස හා අංග සම්පූර්ණ සමතයක් ලෙස ඉදිරිපත් කලේ නැත. එම නිසා නඩුව විභාගයට ගැනීමට තීරණය කරන ලද අතර 2019.09.24 දින නඩු විභාගය ආරම්භ කරමින් පැමිණිලි පාර්ශ්වය මූලික සාක්ෂි ඉදිරිපත් කරනු ලැබීය. මේ ආකාරයෙන් නඩු විභාගය අඛණ්ඩව 2022ක් වූ මාර්තු මාසය දක්වාම පැවති අතර 2022.03.09 දින නඩුව විභාගයට කැඳවන ලද අවස්ථාවේදී පැමිණිලි පාර්ශ්වය විසින් කරුණු දක්වමින් මෙම පැමිණිලිකරු විසින් හලාවත කම්කරු විනිශ්වය සභාව ඉදිරියේ නිඩුවක් ගොනු කර තිබෙන බැවින් හා එකී තීන්දු ප්‍රකාශය ලැබීම නියමිත බැවින් මෙම නඩුව එතෙක් බහා තැබීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේ ය.  වගඋත්තරකාර පාර්ශ්වය ද මෙම ඉල්ලීමට එකඟ තාවය පළ කරන ලද බැවින් නඩුව බහා තැබීමට තීරණය කරන ලදී.

ඒ  අනුව හලාවත කම්කරු විනිශ්වය සභාව ඉදිරියේ විභාග කරන ලද අංක LT/28/2383/2019 දරන නඩුවේ නියෝගය වර්ෂ 2023ක් වූ ජූලි මස 28 වන දින නිකුත් කර තිබිණි. එහි තීන්දුවේ සඳහන් වූයේ වගඋත්තරකරු වෙත රුපියල් හයලක්ෂ විසිදහස් එකසිය හැටක් (රු 620,160.00) මුදලක් වන්දියක් ලෙස ගෙවිය යුතු බවයි. මේ සම්බන්ධයෙන් ඉල්ලුම්කරු බේරුම්කරණය වෙත 2023.10.29 දිනැති ලිපියක් ඉදිරිපත් කරමින් තමන් වෙත වගඋත්තර පාර්ශ්වයන් වන්දි මුදලක් ලැබී ඇති බවත් ඒ කෙසේ වෙතත් මේ වන විට තමාට පෞද්ගලික කරදර බොහෝමයකටත් ආර්ථික අතින් අසීරුතවයකට මුහුණ දීමට සිදුව තිබෙන බැවින් බේරුම්කරණය නඩු විභාගය සඳහා සහභාගි විය නොහැකි බවත් වගඋත්තර ආයතනයේ එකඟතාවයට තමා ද එකඟ වන බවත් එහෙයින් බේරුම්කරණයට සුදුසු යැයි හැගෙන තීන්දුවක් ලබාදී නඩුව අවසන් කරන මෙන් ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කර ඇත.

ඒ කෙසේ වෙතත් නඩුවේ පාර්ශ්වයන් වෙත නැවත 2023ක් වූ ඔක්තෝබර් මස 10 වන දින පෙ.ව. 11.30ට බේරුම්කරණය වෙත කැඳවීමක් සිදු කරන ලද අතර වගඋත්තරකාර පාර්ශ්වය එහිදි නියෝජනය වූව ද පැමිණිලිකාර පාර්ශ්වය ඉදිරිපත් වූයේ නැත. පැමිණිලිකාර පාර්ශ්වය තම පැමිණිම සිදු නොවන බව ලිඛිතවම සිදු කර තිබෙන නිසාත් නඩු විභාගය නැවත කැඳවීමක් කළ ද ඉදිරිපත් නොවීම නිසාත් නඩු විභාගය හෝ සමතයක් හෝ ඇති කර ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගත වීමෙන් නඩු විභාගය එමගින් අවසන් කිරීමට සිදු විය.

එම නිසා පළමු පාර්ශ්වයේ සහභාගීත්වයක් නොමැති වීම හේතුවෙන් කිසිදු ප්‍රදානයක් ලබාදීමකින් තොරව ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කරමි. පළමු පාර්ශ්වයේ ව්‍යවස්ථාපිත හිමිකම්වලට මෙම තීරණය බලපෑමක් ඇති නොකළ යුතුය.

**ලොරා සුමතිපාල,**
බේරුම්කරු.

වර්ෂ 2024 ක්වූ ඔක්තෝබර් මස 10 වැනි දින දී ය.

EOG 11 -  0191

මගේ අංකය: IR/COM/02/2019/286.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2021.05.06 දිනැති හා අංක 2226/50 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.05.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 02, තැ.පෙ. 540, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ.ගාඩිනර් මාවත, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලි පොදු සේවක සංගමය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ.ගාඩිනර් මාවත, අංක 50, තෙවැනි මහල හි පිහිටි ලංකා විදුලිබල මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 57/2021 හා 2024.10.07 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 නොවැම්බර් මස 01 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.

**ප්‍රදානය**
**බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාව**

නඩු අංකය: A 57/2021
IR/COM/02/2019/286

ලංකා විදුලි පොදු සේවක සංගමය
ලංකා විදුලිබල මණ්ඩලය,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
තැ.පෙ. 540,
කොළඹ 02.

*පළමු පාර්ශ්වය*

එදිරිව

ලංකා විදුලිබල මණ්ඩලය,
තෙවැනිමහල,
අංක 50. කිරුල පාර,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

*දෙවන පාර්ශ්වය*

වර්ෂ 2024 ක්වූ ඔක්තෝබර් මස 07 වැනි දින දී ය.

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2021.05.03 දිනැති බේරුම්කරු වශයෙන් මා පත්කොට ඇත.

ඉහත නම් සඳහන් පළමු පාර්ශ්වය සහ දෙවන පාර්ශ්වය අතර පවතින බේරුම්කරණය මගින් විසඳීමට අපේක්ෂිත මෙම ආරවුලට තුඩු දුන් කාරණය පහත පරිදි වේ.

"ලංකා විදුලිබල මණ්ඩලයේ විවිධ සේවා බාණ්ඩවල, විවිධ ශ්‍රේණිවල විවිධ තනතුරු වලට අයත් සේවකයන්ගෙන් සැදුම්ලත් පොදු වෘත්තීය සමිතියක් ලෙස ලියාපදිංචි වෘත්තීය සමිතියක් වන ලංකා විදුලි පොදු සේවක සංගමයේ සභාපති වන පී.ඩී.යූ.මාලක වික්‍රමසිංහ මහතා 2019.08.15 සිට 2020.08.14 දින දක්වා වසරක කාලයකට වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කරන ලෙස සංගමය විසින් 2019.07.23 දින ඉදිරිපත්කළ ලිපියෙන් කරන ලද ඉල්ලීම විදුලිබල මණ්ඩලයේ පාලනාධිකාරිය විසින් ප්‍රතික්ෂේප කිරීම නිසා පී.ඩී.යූ.මාලක වික්‍රමසිංහ මහතාට හා එම වෘත්තීය සමිතියට අසාධාරණයක් සිදුවී තිබේද? අසාධාරණයක් සිදුවී ඇත්නම් හිමිවිය යුතු සහනයන් කවරේද? යන්න පිළිබඳව වේ.”

පළමු පාර්ශ්වකාර ඉල්ලුම්කරු විසින් 2022.10.14 වන දිනැතිව සිය මූලික ප්‍රකාශය සහකාර කම්කරු කොමසාරිස් වෙත යොමු කරමින් වෙනත් දෑ අතර,

- පළමු පාර්ශ්වයේ වෘත්තීය සමිති සභාපති ලෙස කටයුතු කළ පී.ඩී.යූ. මාලක වික්‍රමසිංහ මහතා දෙවන පාර්ශ්වයේ ආයතනයේ පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු කරගෙන යාමට තිබෙන සියලු බාධා ඉවත්කර දෙන ලෙසත්,
- අදාළ වෘත්තීය සමිති අයිතිවාසිකම අහිමි කිරීමේ ක්‍රියාවලිය මගින් පළමු පාර්ශ්වයේ වෘත්තීය සමිතියේ සභාපති පී.ඩී.යූ. මාලක වික්‍රමසිංහ මහතාට පසුගිය කාලය තුළ දෙවන පාර්ශ්වය විසින් අහිමි කළ වැටුප්, දීමනා, උසස්වීම් හා අනිකුත් සියලු වරප්‍රසාද නැවත ලබාදෙන ලෙසත්.
- මෙම ගරු බේරුම්කරණයට සුදුසු යැයි හැගෙන වෙනත් සහ වැඩිමනත් සහන ලබාදීමත් සඳහා ගියෝග කෙරෙන තීන්දුවක් ලබා දෙන ලෙසත්

අයැද ඇත.

ඒ සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය විසින් 2022.02.22 වන දිනැතිව ඉදිරිපත්කර ඇති පිළිතුරු ප්‍රකාශයේ (පළමු ප්‍රකාශයේ) වෙනත් දෑ අතර,

1. මූලික විරෝධතා

- පළමු පාර්ශ්වය 2019.11.19 දින සිට ස්වකැමැත්තෙන් සේවය අතහැර ගොස් ඇති හෙයින් පළමු හා දෙවන පාර්ශ්ව අතර සේවක සේවායෝජක සම්බන්ධතාවක් නොමැති විට සජීවී ආරවුලක් (live dispute) නොපවතින බවත්,

- පළමු පාර්ශ්වය 2019.08.15 සිට 2020.08.14 දක්වා වසරක කාලයකට වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කරන ලෙස ඉල්ලා තිබුනද, පළමු පාර්ශ්වය ඒ වනවිටත් සේවය අතහැර ගොස් ඇති හෙයින් එම සහනය ලබාදිය නොහැකි බවත්,

- සේවය අතහැර යාමේ තීරණයට එරෙහිව නිසි බලධාරියා වෙත අභියාචනයක් කිරීමෙන් තොරව පිරිස් සංග්‍රහයේ 6.13 පරිච්ඡේදයේ ප්‍රතිපාදන අනුගමනය කර නොමැති බවත්,

- පළමු පාර්ශ්වය විසින් මෙම කරුණු සම්බන්ධයෙන්ම මෙම සහනම අදිමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක SC/ FR/02/2020 දරන නඩුව ගොනුකර ඇති හෙයින් පළමු කොට වෙනත් නීති සහනයන් උපයෝගී කරගෙන ඇති බවත්,

- අනීතිකව සේවය අවසන් කිරීමක් බැවින් නැවත සේවයේ පිහිටු වන ලෙස පළමු පාර්ශ්වය විසින් කොළඹ අංක 13 කම්කරු විනිශ්චය සභාවේද නඩුවක් ගොනු කළද එය නිශ්ප්‍රභ කරමින් 2022.01.18 දින නියෝගයක් ලබාදී ඇති බවත්,

- එසේ සහන ලැබීම පිණිස ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ප්‍රකාර නෛතික ක්‍රමවේදය මත කටයුතු කිරීමෙන් අනතුරුව එහිදී අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීම මත එකී නෛතික ක්‍රම වේද වලින් ඉවත්ව වෙනත් යම් නෛතික ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කිරීමට පළමු පාර්ශ්වය උත්සුකවී ඇති බවත්,

- එබැවින් මෙම ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් සහන ලබාදීමට ගරු කාර්මික අධිකරණයට අධිකරණ බලයක් හිමිවී නොමැති හෙයින් මෙම ඉල්ලුම් පත්‍රය මුල් අවස්ථාවේදීම ශිෂ්ප්‍රභ විය යුතු බවත්,

2. ලංකා විදුලිබල කළමණාකාරිත්වය විසින් ලංකා විදුලි පොදු සේවක සංගමයේ ඉල්ලීම මත මෙම පළමු පාර්ශවීය ඉල්ලුම්කරු පූර්ණ කාලීන වෘත්තීය සමිති කටයුතු සඳහා සිව් වසරක් වසරින් වසර දීර්ඝකර ඇති බවත්, ඒ අනුව, ලංකා විදුලිබල මණ්ඩලය අවසන් වරට ලංකා විදුලි පොදු සේවක සංගමය විසින් 2018.07.13 දිනැති ලිපියෙන් කරන ලද ඉල්ලීම මත මෙම පළමු පාර්ශ්වය එනම් පී.ඩී.මාලක වික්‍රමසිංහ පූර්ණ කාලීන වෘත්තීය සමිති කටයුතු සඳහා 2018.08.15 දින සිට 2019.08.14 දක්වා (සිව්වන වසර සඳහා) නිදහස් කිරීමට අනුමැතිය ලබාදී ඇති බවත්.

3. පසුව, පළමු පාර්ශ්වය විසින් තවදුරටත් 2019.07.23 දිනැති ලිපිය මගින් නැවතත් පස්වන වසර සඳහා 2019.08.15 සිට 2020.08.14 දක්වා තව වසරකින් පූර්ණකාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කිරීමට ඉල්ලීමක් කර ඇති නමුත්, එවැනි නිදහස් කිරීමක් පිළිබඳ විදුලිබල මණ්ඩලයේ නිවාඩු නීති සංග්‍රහයේ ප්‍රතිපාදන සලසා නොමැති බවත්, 2019.10.09 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අනුව වසර 4ක් ඉක්මවා කරනු ලබන නිදහස් කිරීම් වලදී පමණක් රජයේ ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 4 වන වගන්තිය අනුව ගිලධාරියෙකු සාමාන්‍යාධිකාරීවරයාගේ අනුමැතිය මත උපරිම වසර 4 ක කාලයක් සඳහා නිදහස් කළ හැකි බවත්, එකී පරිච්ඡේදයේ 4.3 වගන්තිය අනුව මුදවා හැරීමේ කාලය වසර 4 ඉක්මවන විට අධ්‍යක්ෂ මණ්ඩලීය අනුමැතියට යටත්ව වාර්ෂිකව දීර්ඝ කළ හැකි බවත්,

4. එහෙත් එවකට 2019 ජනාධිපතිවරණ කාලසීමාව වූ නිසා එම කාලසීමාව තුළ මැතිවරණ නීතිරීතිවලට සහ ආයතන සංග්‍රහයට පටහැනිව දේශපාලන කටයුතු සඳහා වෘත්තීය සමිති නායකයන් පූර්ණකාලීනව සේවයෙන් මුදවා හැරීම තාවකාලිකව අත්හිටවීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් 2019.10.09 දිනැති ලිපිය මගින් දන්වා ඇති බවත්,

5. එම නිර්දේශ ද සැලකිල්ලට ගෙන පී.ඩී.යූ. මාලක වික්‍රමසිංහ මයා පූර්ණකාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලීය අනුමැතියක් 2019.10.10 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ලබාදී නොමැති බවත්,

6. ලං. වි.ම. සේවකයන් වෘත්තීය සමිති කටයුතු සඳහා හිදහස් කර ඇති කාලසීමාව අවසන් වූ පසු එසේ නැවත රාජකාරී සඳහා වාර්තා කළ සේවකයින් තබා ගැනීමට පුරප්පාඩු නොමැති වීම හේතුවෙන්ද, රාජකාරී ස්ථාන නොමැති වීම නිසාවෙන්ද, ඔවුන්ගේ තනතුරු අනුව පුරප්පාඩු ඇති කාර්යාල සඳහා අනුයුක්ත කිරීම සිදු කරනු ලබන බවත්,

7. වෘත්තීය සමිති කටයුතු සඳහා පූර්ණ කාලීනව නිදහස් කර සිටි ඉල්ලුම්කරුව ඔහුගේ තනතුර අනුව දැනට පුරප්පාඩුව පවතින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (කොළඹ නගරය) වෙත අනුයුක්ත කිරීමට 2019.11.18 දිනැති ලිපිය මගින් කටයුතු කළ බවත්,

8. ලං.වි.ම ප්‍රධාන විධායක නිලධාරියා ලෙස සාමාන්‍යාධිකාරිවරයාට ඕනෑම සේවකයෙකු අවශ්‍යතාව ඇති ස්ථානයක සේවයේ යෙදවිය හැකි බවත්. එකී හේතූන් මත ඉල්ලුම්කරුව වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කර නොමැති බැවින් ඔහු යොදවාගෙන සිදුකළ හැකි කාර්යන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පිරිස්) කාර්යාලය තුල නොතිබූ බැවින්ද, සාමානාධිකාරීවරයාගේ උපදෙස් පරිදි ලං.වි.ම මුලස්ථානයට සමීපව පිහිටා ඇති කාර්යාලය වෙත එනම් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (කොළඹ නගරය) වෙත රාජකාරි සඳහා මාරුකර ඇති අතර, එය සේවා අවශ්‍යතාව මත සද්භාවයෙන් ගන්නා ලද තීරණයක් බවත්,

09. යම් සේවකයෙකුට කිසියම් ස්ථානයක රාජකාරි සඳහා වාර්තා කරන ලෙස උපදෙස් ලැබූ විට එකී නියෝගයට අනුගත වියයුතු බවත්, නැතහොත් පිළිගත හැකි හේතුවක් ඉදිරිපත්කළ යුතු බවත්, නොඑසේ නම් ඒවැනි සේවකයෙකු සේවය අතහැර ගියා සේ සැලකෙන බවත්,

10. පළමු පාර්ශ්වය දෙවන පාර්ශ්වයේ කාර්යාලයේ සිට කි.මී. 4 කටත් නොවැඩි දුරකින් පිහිටි සාමාන්‍යාධිකාරි (කොළඹ නගරය) කාර්යාලය වෙත අනුයුක්තකර තිබියදී ඉල්ලුම්කරු එහි සේවයට වාර්තා නොකිරීම නිසා ඔහු සේවය අතහැර ගියා සේ සලකා 2019.12.04 දිනැති ලිපියක් නිකුත්කර ඇති බවත්,

11. ඒ අනුව ඉල්ලුම්කරුට අදාළව ලං.වි.ම. ලේඛන සහ ලිපි මත පදනම්ව කටයුතු කරමින් යුක්ති සහගතව සද්භාවයෙන් ක්‍රියාකර ඇති බවත්,

12. කරුණු එසේ දෙවන පාර්ශ්වය සහන වශයෙන්
- මූලික විරෝධතා සැලකිල්ලට ගෙන පළමු පාර්ශ්වයේ ඉල්ලීම/පැමිණිල්ල ප්‍රතික්ෂේප හෝ නිෂ්ප්‍රභ කරන ලෙසත්,
- මූලික විරෝධතාවලට අගති රහිතව ඉල්ලීම/පැමිණිල්ල ප්‍රතික්ෂේප හෝ නිෂ්ප්‍රභ කරන ලෙසත්,
- මෙම ආරවුලට අදාළව නිකුත්කර ඇති යොමු කිරීම නිශ්ප්‍රභ කරන ලෙසත්,
- නඩු ගාස්තු සහ ගරු කාර්මික අධිකරණයට සුදුසු යැයි හැඟෙන වෙනත් සහනයක් ලබාදෙන ලෙසත්,

ප්‍රකාශකර ඇත.

ඉන්පසුව දෙවන පාර්ශ්වය විසින් 2022.03.14 දිනැති දෙවන ප්‍රකාශය ගොනුකරමින් වෙනත් දෑ අතර,

1. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 1 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු අතරින් ලංකා විදුලි පොදු සේවක සංගමය නමින් වෘත්තීය සමිතියක් පවතින බව පමණක් පිළිගන්නා අතර, අනෙකුත් කරුණු ප්‍රතික්ෂේප කරන බවත්,
2. පළමු ප්‍රකාශයේ 2 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු අතරින් IR/COM/02/2019/286 පැමිණිලි අංකය පමණක් පිළිගනිමින් සෙසු කරුණු ප්‍රතික්ෂේප කරන බවත්,
3. පළමු ප්‍රකාශයේ 3 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු අතරින් එහි සඳහන් දිනය හැර අනෙකුත් කරුණු පිළිගන්නා බවත්,
4. පළමු ප්‍රකාශයේ 5 වන සම්ප්‍රකාශය පිළිගන්නා බවත්,
5. පළමු ප්‍රකාශයේ 4, 6, 8, 9, 14, 15 සහ 16 වන සම්ප්‍රකාශයන්හි සඳහන් කරුණු නොදන්නා බැවින් ප්‍රතික්ෂේප කරන බවත්,
6. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 7 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු අතරින් පළමු පාර්ශ්වීය ඉල්ලුම්කරු 2010.11.01 සිට වසර 3ක පරිවාස කාලයකට යටත්ව සේවයේ ස්ථිරකර ඇති බව පමණක් පිළිගන්නා අතර, අනෙකුත් කරුණු ප්‍රතික්ෂේප කරන බවත්,
7. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 10 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු අතරින් පළමු පාර්ශ්වීය ඉල්ලුම්කරු 2015.08.15 සිට 2019.08.14 දක්වා පූර්ණ කාලීන වෘත්තීය සමිති කටයුතු සඳහා වාර්ෂිකව රාජකාරියෙන් මුදාහැර ඇතිබව පමණක් පිළිගනිමින්, අනෙකුත් කරුණු ප්‍රතික්ෂේප කරන බවත්,
8. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 11 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු අතරින් 2019.07.23 දිනැති ලිපියක් දෙවන පාර්ශ්වය වෙත යොමුකර ඇතිබව පමණක් පිළිගනිමින්, අනෙකුත් කරුණු ප්‍රතික්ෂේප කරන බවත්,
9. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 12 වන සම්ප්‍රකාශයට පිළිතුරු දෙමින් 2019.09.24 දිනැති ලිපියට පිළිතුරු ලිපියක් යොමුකළ බවත්, ඒ අනුව පළමු පාර්ශ්වීය වෘත්තීය සමිතිය නියෝජනය කිරීම සඳහා සාධාරණ අවස්ථාවක් ලබාදීමට කටයුතුකර ඇතිබව පමණක් පිළිගනිමින්, අනෙකුත් කරුණු ප්‍රතික්ෂේප කරන බවත්,
10. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 13, 23, 45 සහ 46 යන සම්ප්‍රකාශයන් ප්‍රතික්ෂේප කරන බවත්,
11. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 17, 18, 24, 26, 28, 33 සහ 34 යන සම්ප්‍රකාශයන් පිළිගන්නා බවත්,
12. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 19 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු ප්‍රතික්ෂේප කරමින්, ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන ලිපියේ ලං.වි.ම. සභාපති වෙත කිසිවෙකු විසින් සටහනක් තබා ඇති බවත්, එම සටහනේ පැහැදිලි උපදෙසක් හෝ සටහන තැබූ අයගේ නිල මුද්‍රාවක් හෝ නොමැති බැවින් එහි නීත්‍යානුකූලභාවය ගැටළුසහගත බවත්,
13. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 20 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු ප්‍රතික්ෂේප කරමින්, පළමු පාර්ශ්වීය ඉල්ලුම්කරු ආයතනයට කැළලක් වන ලෙස සහ සේවකයන්ගේ කීර්තියට හානි ලෙස කටයුතු කරන බවට වෙනත් වෘත්තීය සංගම් විසින් ලිපි ඉදිරිපත්කර ඇති බවත්, ඉල්ලුම්කරු පූර්ණ කාලීන වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කිරීමේ තීරණය යළි සලකා

බලන ලෙසට ඉල්ලීම් කර ඇතිබවත්, එම වෘත්තීය සමිතියේම සාමාජිකයන් පිරිසක්ද ඉල්ලුම්කරුගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් ගැටළු පවතින බවට ලං.වි.ම. සාමාන්‍යාධිකාරී වෙත පැමිණිල්ලක් යොමුකර ඇතිබවත්,

14. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 21 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු ප්‍රතික්ෂේප කරමින්, පළමු පාර්ශවීය ඉල්ලුම්කරු වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කිරීමට මණ්ඩලීය අනුමැතිය නොලැබීම මත ලං.වි.ම. සාමාන්‍යාධිකාරීවරයාගේ බලතල අනුව සේවා අවශ්‍යතාවය ඇති ස්ථානයක සේවයේ යෙදවූ බවත්, ඒ අනුව ලං.වි.ම. මූලස්ථානයට සමීපව පිහිටා ඇති නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කොළඹ නගරය) වෙත රාජකාරී සඳහා වාර්තා කරන ලෙසට උපදෙස් ලබාදුන් බවත්,

15. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 22 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු ප්‍රතික්ෂේප කරමින්, ස්ථාන මාරුකිරීමේ නියෝගය පිළිනොගෙන බාහිර පාර්ශව හරහා ලං.වි.ම. කළමණාකාරිත්වයට බලපෑම් කිරීම මගින් පළමු පාර්ශවීය ඉල්ලුම්කරු විසින් විෂමාචාරයක් සිදුකර ඇති බවත්,

16. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 25 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු අතරින් IR/COM/02/2019/286 නමැති පැමිණිල්ලක් පළමු පාර්ශ්වය විසින් ගොනුකර ඇතිබව පමණක් පිළිගනිමින්, අනෙකුත් කරුණු ප්‍රතික්ෂේප කරන බවත්,

17. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 27 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු ප්‍රතික්ෂේප කරමින්, පළමු පාර්ශ්වීය ඉල්ලුම්කරු තනතුර අනුව සේවයේ යෙදිය හැකි ආසන්නතම ස්ථානයේ සේවයට අනුයුක්තකර ඇති බවත්, වෘත්තීය සමිතියේ ප්‍රධාන කාර්යාලයට ආසන්නයේම එනම් කි.මී. 4ක දුරින් පිහිටා ඇති නිසා (කොළඹ නගරය) කාර්යාලයේ සේවයට අනුයක්තකර ඇති බවත්,

18. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 29 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු අතරින් 2019.10.17 දිනැති ලිපිය මගින් ඉල්ලුම්කරු ප්‍රධාන කාර්යාලයේ සේවයේ යෙදීමට සුදුසු ස්ථානයක් නොමැති බැවින් අදාල ස්ථාන මාරුව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කරුණු විමසීමක් මැතිවරණ කොමිෂන් සභාවේ ලේකම්ගෙන් සිදුකළ බව පමණක් පිළිගනිමින්, අනෙකුත් කරුණු ප්‍රතික්ෂේප කරන බවත්,

19. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 30 වන සම්ප්‍රකාශයට පිළිතුරු දෙමින් පළමු පාර්ශවීය ඉල්ලුම්කරුගේ ස්ථාන මාරුවීමේ නියෝගය අත්හිටවන ලෙස මැතිවරණ කොමිෂන් සභාව නියෝගකොට තිබුණේ 2019.11.16 ජනාධිපතිවරණය අවසන් වන තෙක් පමණක් බවත්,

20. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 31 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු අතරින් පළමු පාර්ශ්වය විසින් කම්කරු දෙපාර්තමේන්තුවේ පැමිණිල්ලක් කළ බව පමණක් පිළිගනිමින්, අනෙකුත් කරුණු ප්‍රතික්ෂේප කරන බවත්,

21. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 32 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු ප්‍රතික්ෂේපකර ඊට පිළිතුරු දෙමින් 2019.11.16, 2019.11.22 සහ 2019.11.25 යන දිනයන්හි පමණක් නි.සා.(පීරිස්) ශාඛාවේ සේවයට වාර්තාකර ඇති අතර, පළමු පාර්ශවීය ඉල්ලුම්කරුට නි.සා.(කොළඹ නගරය) වෙත රාජකාරි සඳහා වාර්තා කරන ලෙස පැහැදිලි උපදෙස් ලිඛිතව ලබාදී තිබූ අවස්ථාවක එම නියෝගය පැහැර හැර අතිබවත්,

22. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 35 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු අතරින් 2019.11.19 දිනැති ලිපියක් පළමු පාර්ශ්වය විසින් යොමුකර ඇති බව පමණක් පිළිගනිමින්, අනෙකුත් කරුණු ප්‍රතික්ෂේප කරන බවත්,

23. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 36 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු අතරින් 2019.11.19 දින සිට ධූරය අතහැර යාමේ ලිපියක් යොමුකළ බව පමණක් පිළිගනිමින්, අනෙකුත් කරුණු ප්‍රතික්ෂේප කරමින් වැඩිදුරටත් පිළිතුරු දෙමින්, ලං.වි.ම. සේවකයෙකුට යම් ස්ථානයකට රාජකාරි සඳහා වාර්තා කරන ලෙස උපදෙස් ලබාදුන් විට අනිවාර්යෙන්ම එකී නියෝගයට අවනත වියයුතු බවත්, එසේ නොහැකිනම් පිළිගත හැකි හේතුවක් ඉදිරිපත් කළ යුතු බවත්, එසේ අපොහොසත් වන විටෙක සේවකයෙකු ධූරය අතහැර ගියා සේ සලකන බවත්, ඒ අනුව ඉල්ලුම්කරුට ස්ථාන මාරුවීම් ලබාදුන් ස්ථානයට හැර වෙනත් ස්ථානයක සේවයට වාර්තා කිරීමට නොහැකි බැවින් ඉල්ලුම්කරු 2019.11.25 සහ 2019.11.26 දිනයන්හි නි.සා.(පීරිස්) කාර්යාලයට පැමිණීම සේවයට වාර්තා කිරීමක් ලෙස සැලකිය නොහැකි බවත්,

24. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 37 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු ප්‍රතික්ෂේප කරමින්, ඉල්ලුම්කරු පූර්ණ කාලීන වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස්කර නොතිබීමත් සහ ඔහුගේ තනතුරට සරිලන රාජකාරියක් නි.සා.(පීරිස්) කාර්යාලය තුළ නොමැති වීම මත එම සේවකයා එම කාර්යාලයේ තබාගත නොහැකි බවත්, එය ලං.වි.ම. මුදල් අපතේ යැවීමක් බවත්,

25. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 38 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු ප්‍රතික්ෂේප කරමින්, නියෝජ්‍ය කම්කරු කොමසාරිස් සමඟ පැවති පරීක්ෂණයේදී කිසිදු අවස්ථාවක ලං.වි.ම. නියෝජිතයන් මෙම ඉල්ලුම්කරු පූර්ණ කාලීන වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කිරීමට මණ්ඩලීය පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට එකඟ නොවූ බවත්, අදාළ තීරණය මණ්ඩලය විසින් ගතයුතු තීරණයක් බවත් පර්යේෂණයේදී එවැනි එකඟතාවයකට පැමිණ නොමැති හෙයින් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොමැති බවත්,

26. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 39 සහ 41 යන සම්ප්‍රකාශයන් නොදන්නා බැවින් ප්‍රතික්ෂේප කරන බවත්,

27. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 40 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු අතරින් 2019.12.24 දිනැති ලිපියක් පළමු පාර්ශ්වය විසින් යොමුකර ඇති බව පමණක් පිළිගනිමින්, අනෙකුත් කරුණු ප්‍රතික්ෂේප කරමින් පිළිතුරු ලෙස 2020.01.23 දිනැති ලිපියක් යොමුකළ බවත්,

28. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 42 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු අතරින් 2020.01.23 දිනැති ලිපියක් දෙවන පාර්ශ්වය විසින් යොමුකර ඇති බව පමණක් පිළිගනිමින්, අනෙකුත් කරුණු ප්‍රතික්ෂේප කරන බවත්,
29. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 43 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු නඩුවට අදාළ නොවන හෙයින් ප්‍රතික්ෂේප කරන බවත්,
30. පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 44 වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු ප්‍රතික්ෂේප කරමින්, ලං.වි.ම. රජයට අනුබද්ධ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස වෘත්තීය සමිති ආඥාපනතේ වගන්තියක් කඩකොට නොමැති බවත්, ඉල්ලුම්කරුගේ වෘත්තීය සමිති කටයුතුවල නියැලීමේ අයිතියට බලපෑම්කර නොමැති බවත්, ලං.වි.ම. ඇති වෘත්තීය සමිතිවලින් 95%කම නිලධාරී මණ්ඩලය සිය රාජකාරී කටයුතුවල නියැලෙමින් වෘත්තීය සමිති කටයුතුද කරගෙන යන බවත්, ඉල්ලුම්කරුද ආයතනයේ සාමාන්‍ය සේවකයන්ට බලපාන පොදු නීතිරීතිවලින් බැඳී සිටින අතර ඔවුන්ව නිදහස් කිරීමට කාරණයක් නොවන බැවින් ඔහුද අනෙකුත් සේවකයන්ට බලපාන කොන්දේසි වලට යටත් බවත්,

31. පළමු පාර්ශ්වය විසින් අනීතිකව සේවය අවසන් කිරීමක් බවට චෝදනා කරමින් නැවත සේවයේ ප්‍රතිෂ්ඨාපනය කරන ලෙස කොළඹ අංක 13 කම්කරු විනිශ්චය සභාව වෙතද පැමිණිල්ලක් යොමුකර ඇති අතර එය මේවනවිට නිෂ්ප්‍රභ කර ඇතිබවත්, මෙම කරුණු සම්බන්ධයෙන් මෙම සහනම අයදිමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක SC/FR/02/2020 දරන නඩුවක් ගොනුකර ඇති බවත්,

32. කරුණු එසේ දෙවන පාර්ශ්වය සහන වශයෙන්

- දෙවන පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ ඇති මූලික විරෝධතා සැලකිල්ලට ගෙන මුල් අවස්ථාවේදීම පළමු පාර්ශ්වයේ ඉල්ලීම ප්‍රතික්ෂේප හෝ නිෂ්ප්‍රභ කරන ලෙසත්,
- මූලික විරෝධතාවලට අගති රහිතව පළමු පාර්ශ්වයේ ඉල්ලීම ප්‍රතික්ෂේප හෝ නිෂ්ප්‍රභ කරන ලෙසත්,
- මෙම ආරවුලට අදාළව ඇති යොමුකිරීම නිෂ්ප්‍රභ කරන ලෙසත්,
- නඩු ගාස්තු සහ
- ගරු කාර්මික අධිකරණයට සුදුසු යැයි හැඟෙන වෙනත් සහනයන් ලබාදෙන ලෙසත්,

ප්‍රකාශ කර ඇත.

අනතුරුව, පළමු පාර්ශ්වීය ඉල්ලුම්කරු විසින් 2022.08.31 වන දිනැතිව දෙවන පාර්ශ්වකරුගේ පළමු ප්‍රකාශයට ප්‍රතිඋත්තර ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් වෙනත් දෑ අතර,

1. දෙවන පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ ඉදිරිපත් කර ඇති i-vii දක්වා වන මූලික විරෝධතා නෛතික පදනමකින් තොර හුදු සිද්ධිමය ප්‍රකාශ බැවින් සියල්ල ප්‍රතික්ෂේප කරන බවත්,
2. දෙවන පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 2 වන සම්ප්‍රකාශය පිළිගන්නා බවත්,
3. දෙවන පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 3වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු අතරින් 2019.07.23 දිනැති ලිපියක් මගින් ඉල්ලුම්කරු 2019.08.15 සිට 2020.08.14 තෙක් පූර්ණකාලීනව නිදහස් කිරීම සඳහා ඉල්ලීමක් කර තිබූ බව පමණක් පිළිගන්නා බවත්,
   - 3 (i) සම්ප්‍රකාශයේ සඳහන් කරුණු ඔප්පු කරන ලෙසත්,
   - 3 (ii) සම්ප්‍රකාශයේ සඳහන් කරුණුවලට පිළිතුරු වශයෙන් දෙවන පාර්ශ්වය යටතේ ක්‍රියාත්මක වෙනත් වෘත්තීය සමිති නිලධාරීන් අඛණ්ඩව වසර 4කට වැඩි කාලයක් සඳහා පූර්ණ කාලීනව නිදහස්කර තිබීම හේතුවෙන් ඉල්ලුම්කරුට වෙනස්කොට සලකා ඇති බවත්, එනයින් දෙවන පාර්ශ්වය ප්‍රතිබන්ධනය වන බවත්,
   - 3 (iii) සම්ප්‍රකාශයේ සඳහන් කරුණුවලට පිළිතුරු වශයෙන් දෙවන පාර්ශ්වයේ අධීක්ෂණ භාර විෂයභාර අමාත්‍යවරයා විසින් ඉල්ලුම්කරු පූර්ණකාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කිරීමට 2019.10.02 දිනැතිව ලිඛිත උපදෙස් ලබාදී තිබියදී එකී උපදෙස් නොසලකා හැර ඇති බවත්,
4. දෙවන පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 4වන සම්ප්‍රකාශයට පිළිතුරු වශයෙන් එකී කරුණු ඔප්පු කිරීම දෙවන පාර්ශ්වය සතු බවත්, 2019.10.12 දිනැති මැතිවරණ කොමිෂන් සභාවේ ලිපියක් මගින් දෙවන පාර්ශ්වයට නියෝගකර ඇත්තේ ඉල්ලුම්කරුගේ ස්ථාන මාරුව හෝ අනුයුක්ත කිරීම අත්හිටවන ලෙස බවත්, ඊට පටහැනිව කරුණු කිව නොහැකි සේ දෙවන පාර්ශ්වය ප්‍රතිබන්ධනය වන බවත්,

5. දෙවන පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 5 වන සම්ප්‍රකාශයට පිළිතුරු වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව විවෘත මනසකින් ඉදිරිපත් කළ යුතුව තිබුනද, දෙවන පාර්ශ්වයේ සාමාන්‍යාධිකාරී විසින් ද්වේශ සහගතවත්, වෘත්තීය සමිති විරෝධී ලෙසත්, වෙනස්කොට සලකමින් ඉල්ලුම්කරු පූර්ණකාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් නොකරන බවට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ සටහනක් යොදා ඇති බැවින්, එකී පත්‍රිකාව ඉදිරිපත්කර ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වෙනස් කිරීමේ අරමුණින් බැවින් පළමු පාර්ශ්වයේ වෘත්තීය සමිතිය සහ ඉල්ලුම්කරු කෙරෙහි වෙනස්කොට සැලකීමක් නොකළා යැයි කිව නොහැකි සේ දෙවන පාර්ශ්වය ප්‍රතිබන්ධනය වන බවත්, සාමාන්‍යාධිකාරීවරයාගේ සැලසුම්සහගත ක්‍රියාවක් ලෙස පළමු පාර්ශ්වයේ වෘත්තීය සමිතිය සහ ඉල්ලුම්කරු සම්බන්ධව පූර්ණ විනිශ්චය අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මත සටහන්කර තිබීම හේතුවෙන් නිදහස් කිරීම අනුමතකර නොමැති බවත්,

6. දෙවන පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 6වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු ප්‍රතික්ෂේප කරමින් එකී ඔප්පු කරන ලෙසත්, ඉල්ලුම්කරු 2019.08.15 සිට 2019.11.24 දක්වා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) ශාඛාවේ සේවයට වාර්තාකළ බවත්, පූර්ණකාලීන වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස්කර ඇති ප්‍රධාන වෘත්තීය සමිති නායකයින්/නිලධාරීන් නිදහස්කර ඇති කාලය අවසන් වීමෙන් පසු නැවත නිදහස් කිරීමේ අනුමැතිය දෙන තෙක් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) ශාඛාවේ සේවයට වාර්තා කිරීම සාමාන්‍ය තත්වයක් බවට පූර්වාදර්ශ ඇති බවත්, අඛණ්ඩව වසර 20කට ආසන්න කාලයක් දිගින් දිගටම පූර්ණකාලීන වෘත්තීය සමිති කටයුතු සඳහා පූර්ණ කාලීනව එකම වෘත්තීය සමිති නිලධාරියා නිදහස් කිරීමට දෙවන පාර්ශ්වය කටයුතුකර ඇති බවට පූර්වාදර්ශ බොහෝ ඇතිබවත්,

7. දෙවන පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 7වන සම්ප්‍රකාශයට පිළිතුරු වශයෙන් ඉල්ලුම්කරුගේ තනතුරට (මාණ්ඩලික සම්බන්ධීකාරක) බඳවාගනු ලබන්නේ උපාධිධාරින් බවත්, අවසාන වශයෙන් 2010.11.01 දින නිලධාරීන් 6 දෙනෙකු බඳවාගෙන ඇති බවත්, මේ වනවිට පුරප්පාඩු 70ක් පමණ පවතින නමුත්, දෙවන පාර්ශවයේ ඇතැම් ඒකකවල ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලවල එක් කාර්යාලයක නිලධාරීන් දෙදෙනා බැගින් සේවයේ යොදවා ඇති බවත්, අවශ්‍ය වූවානම් දෙවන පාර්ශ්වයේ ප්‍රධාන කාර්යාලයේ මෙම තනතුරේ විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් තිබූ බැවින් ඊට අනුයුක්ත කළ හැකිව තිබූ බවත්, මෙම ස්ථාන මාරුව අසද්භාවී බවත්,

8. දෙවන පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 8වන සම්ප්‍රකාශයේ සඳහන් කරුණු ප්‍රතික්ෂේප කරමින්, සාමාන්‍යාධිකාරීවරයාට ඕනෑම සේවකයකු අවශ්‍යතාව ඇති ස්ථානයක සේවයේ යෙදවිය හැකි වුවත්, වෘත්තීය සමිති නායකයකු එසේ සේවයේ යෙදවීමේ බලය ඔහුට නොමැති බවත්, පූර්ණකාලීනව නිදහස්කර නොමැති වුවද ඉල්ලුම්කරු මූලස්ථානයට සමීපයේ පිහිටා ඇති කාර්යාලයකට හෝ ස්ථාන මාරු කිරීමට සාමාන්‍යාධිකාරීවරයාට අයිතියක් නොමැති බවත්, ඒ අනුව ඔහු විසින් තම බලය අතික්‍රමණය කරමින් (Ultra vires) අත්තනෝමතිකව කටයුතුකර ඇති බවත්, ස්ථාන මාරු ලිපියේ අන්තර්ගතය අනුව සේවයේ අවශ්‍යතාව මත ස්ථාන මාරුකලේ යැයි කීමට නොහැකි වන සේ දෙවන පාර්ශ්වය දැනටමත් ප්‍රතිබන්ධනය වී ඇති බවත්, එකී ස්ථාන මාරුව සද්භාවයෙන් තොරව ද්වේශ සහගතව ලබා දෙන ලද්දක් බවත්,

9. දෙවන පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 9 වන සම්ප්‍රකාශයට පිළිතුරු වශයෙන් යම් සේවකයෙකු යම් ස්ථානයක රාජකාරියට වාර්තා කරන ලෙස උපදෙස් ලද විට ඊට අනුගත විය යුතු වන්නේ සද්භාවයෙන් දෙන ලද උපදෙසක් නම් පමණක් බවත් අසද්භාවයෙන් කරන ලද උපදෙස් පිළිපැදීමට සේවකයන් බැඳී නොමැති බවත්, කාර්මික ආරාවුලක් සම්බන්ධව කාර්මික අධිකරණයේ නඩු ආරම්භකර තිබියදී ඊට පටහැනිව ස්ථානමාරු කිරීම අත්තනෝමතික ක්‍රියාවක් බවත්, වෘත්තීය සමිති නායකයෙකු ස්ථාන මාරු කිරීමේ පිළිවෙත දෙවන පාර්ශ්වයේ ස්ථාන මාරු ප්‍රතිපත්තියෙහි පැහැදිලිව සඳහන්කර ඇති බවත්, ඉල්ලුම්කරු සේවය හැරගියා සේ සැලකීමට කිසිදු සදාචාරයක් නොමැති බවත්,

10. දෙවන පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 10 වන සම්ප්‍රකාශයට පිළිතුරු වශයෙන් දෙවන පාර්ශ්වයේ ප්‍රධාන කාර්යාලයේ සිට කිලෝමීටර 4කටත් අඩු දුරකින් පිහිටි ස්ථානයකට සේවයේ අනුයුක්ත කලායැයි කිම මෙම ප්‍රස්තුත කරුණට අදාළ නොමැති බවත්, ආරවුල ඇත්තේ දුර ප්‍රමාණයේ නොව අනුගමනය කරන ලද ක්‍රමවේදය තුළ බවත්, වැරදි ක්‍රමවේදයක් අනුගමනය කර අසද්භාවයෙන්, ද්වේශසහගතව සහ අත්තනෝමතිකව ලබාදුන් අනීතික ස්ථාන මාරුව සාධාරණය කිරීමට උත්සහ දරන බවත්, 2019.12.24 දිනැති ඉල්ලුම්කරු සේවය අතහැර ගියා සේ සලකන ලිපිය අනීතික බවත්,

11. දෙවන පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ 11 වන සම්ප්‍රකාශයට පිළිතුරු වශයෙන් ඉල්ලුම්කරුට අදාළ දෙවන පාර්ශ්වය ලේඛන සහ ලිපි මත පදනම්ව කටයුතු කළේ යැයි කීව නොහැකි සේ ප්‍රතිබන්ධනය වී ඇතිබවත්, පූර්ණ කාලීන වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කිරීමට විදුලිබල හා බලශක්ති විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී තිබියදී එකී ලේඛනය මත කටයුතු කිරීමටත් හා ස්ථානමාරු ප්‍රතිපත්තියක් ලිඛිතව තිබියදී ඒ මත පදනම්ව කටයුතු කිරීමට හා වෘත්තීය සමිති සම්බන්ධව කටයුතු කිරීමේ දී අදාළ නීති රෙගුලාසි පරිදි කටයුතු කිරීමට දෙවන පාර්ශ්වය අපොහොසත් වී ඇති බවත්, යුක්ති සහගතව හා සද්භාවයෙන් ක්‍රියාකර ඇතිබව කීමට නොහැකි වන සේ දෙවන පාර්ශ්වය ප්‍රතිබන්ධනය වී ඇතිබවත්, ඉල්ලුම්කරු සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය අනීතික, අසාධාරණ, අයුක්ති සහගත, අත්තනෝමතික, ද්වේශසහගත හා අසද්භාවීව කටයුත කර ඇති බවත්, පදනම් ,

12. 2015 වසරේ වෘත්තීය සමිති නිලධාරීන් මුදා හැරීම

- අම්පාර ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලයේ සේවය කරමින් සිටි වෘත්තීය සමිති නියෝජිතයෙකු වූ අයකැමි ලිපිකරුවෙකු පූර්ණ කාලීන වෘත්තීය සමිති කටයුතු සඳහා මුදාහැරීමට අනුමතකර ඇති බවත්,
- 2015.06.11 දින සිට ඔහු අවසරයකින් තොරව විදුලි ඉංජිනේරු (අම්පාර) වෙත සේවයට වාර්තාකර නොමැති අතර, 2015.06.17 දිනට වහාම සේවයට වාර්තා කරන ලෙස ලිඛිතව දැනුම් දී ඇති බවත්,
- සේවයට වාර්තා නොකිරීම නිසා අම්පාර කාර්යාලයේ අත්‍යවශ්‍ය රාජකාරී ගණයට වැටෙන රාජකාරියක් වන මුදල් කවුළුව පවත්වාගෙන යාමට බාධා පැමිණ ඇති අතර,
- ඒ අනුව එම නිලධාරියා පූර්ණකාලීන වෘත්තීය සමිති කටයුතු සඳහා මුදාහැරීමට අනුමතකළ නොහැකි බවට සහ එසේ නිදහස් කරන බවට විදුලි ඉංජිනේරු (අම්පාර) විසින් ලිඛිතව හෝ වාචිකව අදාළ වෘත්තීය සමිති නිලධාරියාට උපදෙස් ලබා නොමැති බවටත් විදුලි ඉංජිනේරු විසින් දන්වා ඇති බවත්,
- සේවයට වාර්තා නොකිරීම පිළිබඳව 2015දී එකී වෘත්තීය සමිති නිලධාරියාට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් හෝ ධූරය හැරයාමේ නිවේදන නිකුත් කිරීමක් සිදුකර නොමැති තත්වයක් තුළ මෙම ආරවුලේදී පළමු පාර්ශ්වයට වෙනස්කොට සලකා ඇති බවත්,

13. 2019 වසරේ වෘත්තිය සමිති නිලධාරීන් මුදාහැරීම

- 2019 වසර වනවිට ඉහත කී අයකැමි ලිපිකරු පාලන සම්බන්ධීකාරක තනතුරට උසස්කර තිබූ අතර, 2019.05.27 සිට 2020.05.26 දක්වා පස්වන වසර සඳහාද අඛණ්ඩව වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කිරීමට අනුමැතිය දී ඇති බවත්,
- කෙසේ නමුත් එකී නිලධාරියාට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) ඉංජිනේරු කේ.කේ. දසනායක යන අය විසින් 2019.11.26 දිනැතිව ලිපියක් නිකුත් කරමින් 2019.11.26 දින දක්වා පමණක් වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කරන බව දන්වා ඇති අතර, 2019.11.18 දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) වෙත වාර්තා කරන ලෙස නියෝගකර ඇති නමුත්, 2019.11.16 සිට සේවයට වාර්තාකර නොමැති බවත්,
- 2019.12.04 දිනැතිව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) කේ.කේ.දසනායක යන අයගේ අත්සනින් යුතුව ඒ වන විට පාලන සම්බන්ධිකාරක ලෙස උසස් කර ඇති එම නිලධාරියාගේ ඉල්ලීම පරිදි කියමින් එකී නිලධාරියාගේ ගම්පලාත වන අම්පාර විදුලි ඉංජිනේරු (බෙදාහැරීම් හා තැනීම්) කාර්යාලයට ස්ථාන මාරුවක්ද ලබාදී 2019.12.15 දින රාජකාරී වාර්තා කළ හැකිවන පරිදි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) අංශයෙන්ද මුදා හැර ඇති බවත්,
- නමුත් පැමිණීමේ ලේඛන අනුව එම නිලධාරියා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) කාර්යාලය වෙත ද සේවයට වාර්තාකර නොමැති බවත්,
- සේවයට වාර්තා නොකළ සේවකයෙකුට ඔහුගේ ඉල්ලීම පරිදි ඔහුගේම ගම්පළාත වෙත ස්ථාන මාරුවීමක් ලබාදීමට දෙවන පාර්ශවය කාරුණික වී ඇතිබවත්,
- නමුත්, පළමු පාර්ශ්වය සම්බන්ධව දෙවන පාර්ශ්වය කාරුණිකවී නොමැති බවත්,

14. - 2019.11.25 දිනැතිව සේවයට අනුයුක්ත කිරීම මැයෙන් ඉල්ලුම්කරු වෙත වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) ඉංජිනේරු එච්.ආර්.පී.වන්නිආරච්චි යන අයගේ අත්සනින් ලිපියක් නිකුත් කර ඇති බවත්,

- 2019.11.26 දිනැතිව වැටුප් නතර කිරීම මැයෙන් ඉල්ලුම්කරු වෙත වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) ඉංජිනේරු එච්.ආර්.පී.වන්නිආරච්චි යන අයගේ අත්සනින් ලිපියක් නිකුත් කර ඇති බවත්,
- 2019.11.26 දිනැතිව සේවයට අනුයුක්ත කිරීම මැයෙන් ඉල්ලුම්කරු වෙත වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) ඉංජිනේරු එච්.ආර්.පී.වන්නිආරච්චි යන අයගේ අත්සනින් ලිපියක් නිකුත් කර ඇති බවත්,

- ඒසේ තිබියදී 2019.11.26 දිනැතිව වෘත්තීය සමිති කටයුතු සඳහා පූර්ණ කාලීන නිදහස් කිරීම මැයෙන් පෙර කී අයකැමි ලිපිකරු වෙත වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පිරිස්) ඉංජිනේරු කේ.කේ. දසනායක නැමැත්තෙකුගේ අත්සනින් ලිපියක් නිකුත් කර ඇති බවත්,
- 2019.12.04 දිනැතිව ස්ථාන මාරු කිරීම මැයෙන් 2019.11.26 සිට 2019.12.04 දක්වා දින 08ක් ඇතුළත පාලන සම්බන්ධීකාරක ලෙස උසස්වීම්වලද පෙර කී අයකැමි ලිපිකරු වෙත ලිපිය නිකුත්කර ඇත්තේද වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පිරිස්) ඉංජිනේරු කේ.කේ. දසනායක නැමැත්තෙකු බවත්,
- ඒ අනුව, 2019.11.26 සිට 2019.12.04 දක්වා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පිරිස්) යන තනතුරේ දෙදෙනෙකු එකවර කටයුතු කර ඇති බවත්,
- වන්නිආරච්චි යන අයගේ කරුණාව ලබා අයකැමි ලිපිකරු තනතුරේ සිට පාලන සම්බන්ධීකාරක තනතුර දක්වා දින 08ක් තුළ උසස්වීම් ලැබීමට වාසනාවන්ත වී ඇති බවත්,
- දසනායක යන අයගේ ද්වේශ සහගත පළිගැනීමට හා වෙනස් කොට සැලකීමට භාජනය වීමට ඉල්ලුම්කරු අවාසනාවන්ත වී ඇති බවත්,

15.කරුණු එසේ හෙයින්,

- දෙවන පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ ඉදිරිපත්කර ඇති මූලික විරෝධතා නීතිය ඉදිරියේ මූලික විරෝධතා ලෙස සැලකිය නොහැකි බැවින් එකී කරුණු සියල්ල ප්‍රතික්ෂේප කරන ලෙසත්,
- පළමු පාර්ශ්වයේ පළමු ප්‍රකාශය සහ දෙවන ප්‍රකාශයේ ඉදිරිපත්කර ඇති කරුණු සැලකිල්ලට ගෙන මෙම ආරාවුලට අදාළ නිකුත් කරඇති යොමු කිරීම උගත් බේරුම්කරණය ඉදිරියේ මෙම ආරාවුල විභාගයට ගන්නා ලෙසත්
- පළමු පාර්ශ්වයේ වෘත්තීය සමිති සභාපති ලෙස කටයුතු කළ ජී.ඩී.යූ. මාලක වික්‍රමසිංහ මහතා දෙවන පාර්ශ්වයේ ආයතනයේ පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු කරගෙන යාමට තිබෙන සියලු බාධා ඉවත්කර දෙන ලෙසත්,
- අදාළ වෘත්තීය සමිති අයිතිවාසිකම් අහිමි කිරීමේ ක්‍රියාවලිය මගින් පළමු පාර්ශ්වයේ වෘත්තීය සමිති සභාපති ජී.ඩී.යූ. මාලක වික්‍රමසිංහ මහතාට පසුගිය කාලය තුළ දෙවන පාර්ශ්වය විසින් අහිමි කළ වැටුප් දීමනා, උසස්වීම් හා අනිකුත් සියලු වරප්‍රසාද නැවත ලබා දෙන ලෙසත්,
- මෙම ගරු බේරුම්කරණයට සුදුසු යැයි හැගෙන වෙනත් සහ වැඩිමනත් සහන ලබාදීමත් සඳහා නියෝග කෙරෙන ප්‍රදානයක් ලබා දෙන ලෙසත්,

ප්‍රකාශ කර ඇත.

*පළමු පාර්ශ්වීය ඉල්ලුම්කරුගේ සහ දෙවන පාර්ශවකරුගේ උත්තරවාද මගින් පහත සඳහන් කරුණු දෙපාර්ශ්වය විසින් පිළිගෙන ඇත.*

- *පළමු පාර්ශ්වකාර ඉල්ලුම්කරු 2010.11.01 සිට වසර 3ක පරිවාස කාලයකට යටත්ව සේවයේ ස්ථිරකර ඇති බව*
- *ලංකා විදුලි පොදු සේවක සංගමය නමින් වෘත්තීය සමිතියක් පවතින බව*
- *පළමු පාර්ශ්වකාර ඉල්ලුම්කරු 2015-2019 දක්වා වසර 4ක් සඳහා පූර්ණ කාලීන වෘත්තීය සමිති කටයුතු වෙනුවෙන් නිදහස් කරන ලෙස ඉල්ලීමක් සිදුකර ඇති බව*
- *ඒකී පූර්ණ කාලීන වෘත්තීය සමිති කටයුතු වෙනුවෙන් නිදහස් කරන මෙන් කළ ඉල්ලීම දෙවන පාර්ශ්වය විසින් බැහැර කළ බව*

ඉහත කී මූලික විරෝධතා සම්බන්ධයෙන් පළමු පාර්ශ්වය විසින් 2022.10.03 දිනැතිව සහ දෙවන පාර්ශ්වය විසින් 2022.03.28 දිනැතිව ගොනුකර ලද ලිඛිත දේශන සලකා බැලීමෙන් අනතුරුව, 2022.11.17 දිනැති නියෝගය ලබාදෙමින් බේරුම්කරණය මගින් ප්‍රකාශ කර සිටියේ, 1. II, III, IV **මූලික විරෝධතා සිද්ධිමය කරුණු මත පැන නැගෙන හෙයින් විධිමත් සාක්ෂි විමසීමකින් තොරව නියෝගයක් ලබාදිය නොහැකි බැවින් එකී විරෝධතා විභාගය අවසානයේ තීරණය කරන බවත්, IV, V, VI, VII වන මූලික විරෝධතා ප්‍රතික්ෂේප කරන බවත්ය.** එසේම, හඩුව ඉදිරියට පවත්වාගෙන යාමට තීරණය කරමින් දිග 14ක් ඇතුළත පළමු

පාර්ශ්විය ඉල්ලුම්කරුගේ මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශය ගොනු කරන ලෙසත් ගරු අධිකරණය විසින් 2022.11.17 වනදින නියෝග කර ඇත.

ඒ අනුව, පළමු පාර්ශ්වීය ඉල්ලුම්කරු විසින් 2022.12.05 වන දින සිය මූලික සාක්ෂි දිවිරුම් ප්‍රකාශය සමග **A1-A64** දක්වා ලේඛන ගොනුකරමින්, වැඩිදුරටත් දක්වා ඇත්තේ, වෘත්තීය සමිතිවලට එරෙහිව සේවායෝජකයන් කටයුතු කිරීම 1999 අංක 56 දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනතේ 32අ (අ), (ආ), (ඇ) ().(i), (ඉ), (ඊ) (i).(ii), වගන්ති උල්ලංඝණයක් බවත්, දෙවන පාර්ශ්වයේ හැසිරීම අනීතික, අසාධාරණ, අයුක්ති සහගත, පක්ෂග්‍රාහී, ස්වාභාවික යුක්ති මූලධර්ම අමුඅමුවේ උල්ලංඝණය කිරීමක් බවත්ය. කරුණු එසේ හෙයින්,

- පුද්ගලිකව ඉල්ලුම්කරුට හො ලංකා විදුලි පොදු සේවක සංගමයට අසාධාරණයක් සිදුවී ඇතිබවට නියෝගයක් නිකුත් කරන ලෙසත්,
- පූර්ණ කාලීනව වෘත්තීය සමිති කරගෙන යාමට ඇති බාධා ඉවත් කරන ලෙසත්,
- ඉල්ලුම්කරුට අහිමිකළ වැටුප් දීමනා උසස් වීම් හා අනිකුත් සියලු වැරප්‍රසාද ලබා දෙන ලෙසත්,
- ඉල්ලුම්කරුට හා ලංකා විදුලි පොදු සේවක සංගමයට සිදුවූ හානි පූර්ණය සඳහා ගරු බේරුම්කරණයට සුදුසු යැයි හැගෙන වෙනත් සහ වැඩිමනත් සහන ලබාදීමට කටයුතු කරන ලෙසත්,

අයැද ඇත.

ඉහත කී මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශය මත ඇරඹී සාක්ෂි විභාගයේදී, ඉල්ලුම්කරු හරස් ප්‍රශ්න සහ නැවත ප්‍රශ්නවලට භාජනය කිරීමෙන් අනතුරුව පළමු පාර්ශ්වයේ නඩුව අවසන් කරන ලදී. එහිදී දෙවන පාර්ශ්වය වෙනුවෙන් R12 සිට R22 දක්වා ලේඛන ලකුණුකර ඇත.

අනතුරුව දෙවන පාර්ශ්වකාර ලං.වි.ම. වෙනුවෙන් එකම සාක්ෂිකරු ලෙස ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයේ මානව සම්පත් නිලධාරී, අබ්දුල් මජීඩ් මොහොමඩ් සමීල් මහතා මූලික සාක්ෂි, හරස් ප්‍රශ්න සහ නැවත ප්‍රශ්නවලට ලක්කරමින් R12 සිට R11 දක්වා ලේඛන ලකුණුකර දෙවන පාර්ශ්වයේ නඩුව අවසන් කර ඇත.

ඉහත සඳහන් එක් එක් කරුණු මෙම ආරාවුලට අදාල සාක්ෂි විභාගයේදී කොපමණ දුරට පාර්ශ්ව විසින් පිළිගෙන තිබේද එසේත් නැතහොත් ඔප්පුකර තිබේද යන්න විමසා සිටිමි. ඒ අනුව, බේරුම්කරු ලෙස මා වෙත ගැසට් පත්‍රය මගින් යොමුකළ ආරාවුලේ ස්වභාවය පමණක් සැලකිල්ලට ගනිමින්, පළමු පාර්ශ්වකාර ඉල්ලුම්කරු විසින් අයැද ඇති කිනම් සහන ප්‍රදානය කළ හැක්කේද සහ කිනම් සහන බැහැර කළ යුත්තේද යන්න තීරණය වනු ඇති අතර විසඳිය යුතු ප්‍රධාන කරුණු පහත සඳහන් පරිදි වේ.

1. පළමු පාර්ශ්වකාර ඉල්ලුම්කාර පී.ඩී.යූ. මාලක වික්‍රමසිංහ මහතා 2019.08.15 සිට 2020.08.14 දින දක්වා වසරක කාලයකට වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කරන ලෙස සංගමය විසින් කරන ලද ඉල්ලීම පාලනාධිකාරිය විසින් ප්‍රතික්ෂේප කිරීම නිසා එකී ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුව තිබේද ?
2. පළමු පාර්ශ්වකාර ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුවී ඇත්නම් හිමිවිය යුතු සහන කවරේද ?
3. පළමු පාර්ශ්වකාර ඉල්ලුම්කාර පී.ඩී.යූ. මාලක වික්‍රමසිංහ මහතා එපරිද්දෙන් වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් නොකිරීම මත අදාළ පළමු පාර්ශ්වකාර වෘත්තීය සමිතියට අසාධාරණයක් සිදුව තිබේද ?
4. පළමු පාර්ශ්වකාර වෘත්තීය සමිතියට අසාධාරණයක් සිදුවී ඇත්නම් හිමිවිය යුතු සහන කවරේද ?

බේරුම්කරු වශයෙන් මාගේ කාර්යභාරය වනුයේ පරීක්ෂණයේ ස්වභාවය, ආරාවුල ඉදිරිපත් කරනු ලබන අවස්ථාව වන විට පාර්ශ්වයන්ගේ අයිතීන් හා වගකීම් සහ අයැද ඇති සහන මත සාධාරණ සහ යුක්ති සහගත ( just and equitable) ප්‍රදානයක් ලබා දීමයි. එවැනි සාධාරණ සහ යුක්ති සහගත ( just and equitable) ප්‍රදානයක් ලබාදීම සඳහා ඉහත කී විසඳිය යුතු ප්‍රශ්න පිළිබඳව එක්ව සහ/හෝ වෙන් වෙන්ව සවිස්තරාත්මකව විමසා බලනු ලබන අතර, ***Thirunavakarashu v. Siriwardena (1981) 1 SLR 185 at 191*** නඩුව ප්‍රකාර බලතල ක්‍රියාවට නංවනු ඇත.

*‘ An industrial arbitrator has much wider powers both as regards scope of the inquiry and the kind of orders he can make than an arbitrator in civil law. In short, we can fairly say that arbitration under the industrial law intended to be even more liberal, informal. And flexible than the commercial arabitration ”*

1. පළමු පාර්ශ්වකාර ඉල්ලුම්කාර පී.ඩී.යූ. මාලක වික්‍රමසිංහ මහතා 2019.08.15 සිට 2020.08.14 දින දක්වා වසරක කාලයකට වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කරන ලෙස සංගමය විසින් කරන ලද ඉල්ලීම දෙවන පාර්ශ්වය විසින් ප්‍රතික්ෂේප කිරීම නිසා එකී ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුව තිබේද ?

මෙම ආරාවුලේ මාහට බේරුම් කිරීමට බලය පැවරී ඇති පරාසය වන්නේ ඉල්ලුම්කාර පී.ඩී.යූ. මාලක වික්‍රමසිංහ මහතා 2019.08.15 සිට 2020.08.14 දින දක්වා වසරක කාලයකට වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කරන ලෙස පළමු පාර්ශ්වකාර සංගමය විසින් කරනලද ලිඛිත ඉල්ලීම දෙවන පාර්ශ්වය විසින් ප්‍රතික්ෂේප කිරීම නිසාවෙන් අසාධාරණයක් සිදුවූවාද යන්න තීරණය කිරීමට පමණක් බැවින් එකී කාරණයට පමණක් මෙම ආරාවුලේ ප්‍රදානය සීමා වන බවත්, සේවය අත්හිටවීම හෝ අතහැරයාම යන කාරණා මාහට යොමුකළ ආරාවුලේ අවශේෂ කාරණයක් පමණක් බවත් විශේෂකොට ප්‍රකාශකර සිටිමි.

ඉල්ලුම්කරු 2015.08.15 සිට 2019.08.14 දින තෙක් වසර 4 ක් පුරාවට පැවති නිලවරණ මගින් සභාපති වශයෙන් තේරී පත්වීම මත සහ අදාළ වෘත්තීය සමිතියේ සාමාජිකයන් සංඛ්‍යාව 3000 ඉක්මවීම මත ඔහු වෘත්තීය සමිති කටයුතු වෙනුවෙන් ක්‍රමානුකූලව, නීති ප්‍රකාරව පූර්ණකාලීනව නිදහස් කර ඇතිබව ඉල්ලුම්කරු විසින් උත්තරවාද හා සාක්ෂි මගින් පිළිගෙන ඇත. ඉල්ලුම්කරුගේ හරස් ප්‍රශ්න අවස්ථාවේදී දෙවන පාර්ශ්වය විසින් R2-R5 දක්වා ලකුණු කරන ලද ලේඛන මගින් ද එය තහවුරු කර ඇත. කෙසේ නමුත් මෙම ආරාවුලට තුඩුදෙන කාරණාව හටගන්නේ ඉල්ලුම්කරු පළමු පාර්ශ්වයේ වෘත්තීය සමිති කටයුතු වෙනුවෙන් නීතිප්‍රකාරව පස්වන වසර සඳහා පූර්ණ කාලීනව නිදහස් කරන ලෙස කරන ලද ඉල්ලීම දෙවන පාර්ශ්වය විසින් ප්‍රතික්ෂේප කිරීමත් සමගය.

I. ඉල්ලුම්කරු වසර 4 ක් සඳහා වෘත්තීය කටයුතු සඳහා නිදහස් කර ඇති පසුබිමක පස්වන වසර සඳහා නිදහස් කිරීමට දෙවන පාර්ශ්වයට හැකියාව පවතී ද?

ලංකා විදුලිබල මණ්ඩලයේ එනම්, දෙවන පාර්ශ්වයේ වෘත්තීය සමිති සම්බන්ධව ආයතනික වශයෙන් නීති රෙගුලාසි නොපවතින හෙයින්, ආයතනික සංග්‍රහයේ අනුරූපී විධිවිධාන ක්‍රියාත්මක වන බව පැහැදිලිය නමුත්, දෙවන පාර්ශ්වය විසින් සාක්ෂි විභාගයේදී, ඇතැම් අවස්ථාවක ආයතන සංග්‍රහය සෘජුවම දෙවන පාර්ශ්වයට අදාළ නොවන බවත්, R12 චක්‍රලේඛය මත ගන්නා ලද R13 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව නිලධාරීන් වසර 4 ඉක්මවා පූර්ණකාලීනව නිදහස් කිරීම සම්බන්ධව කටයුතු කරනු ලබන බවත් දක්වා ඇත. එසේ වුවද , දෙවන පාර්ශ්වයේ උත්තරවාද මගින් දක්වා ඇත්තේ ආයතන සංග්‍රහය අනුව තමන් වෘත්තීය සමිති පිළිබඳ ක්‍රියාත්මක වන බවයි. මෙහි පරස්පරතාවක් තිබුනද, මෙම ආරාවුලට ප්‍රස්තුත වන ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 4 වන වගන්තියේ ඇතුළත් ප්‍රතිපාදන R13 හි අන්තර්ගත බැවින් එකී පරස්පරතාව පසෙක ලා ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන විශ්ලේෂණය කරමි.

ආයතන සංග්‍රහය XXV පරිච්ඡේදය 4 වන වගන්තිය

4.1 සංගමයක නිලධරයෙකු පළමු වතාවට වර්ෂ දෙකක කාලයකට හෝ ඔහු සංගමයේ තනතුරු දරන තාක්කල් යන දෙකින් වඩාත් කෙටි කාලය දක්වා සේවයේ හදිසි අවශ්‍යතාවන්ට යටත්ව පූර්ණකාලීනව සංගමයේ කටයුතු සඳහා මුදාහැරිය හැක. අදාළ සංගමයේ ඉල්ලීම මත නිලධරයෙකුගේ මුදාහැරීමේ කාලය වර්ෂ 4 ක් දක්වා දීර්ඝ කළ හැකිය.

4.2 නිලධරයෙකු මුදාහැරීමට නම් සංගමයේ සාමාජිකත්වය විසිරී ඇති විට යටත් පිරිසෙයින් සාමාජිකයන් 1000 ක් සහ විසිරී නැති විට හෝ එක් ආයතනයකට හෝ සේවා ස්ථානයකට සීමාවී ඇති විට යටත් පිරිසෙයින් සාමාජිකයන් 1500 ක් සංගමටය් සිටිය යුතුය. සාමාජික සංඛ්‍යාව 3000 ක් ඉක්මවා සිටින සංගමයක් වෙනුවෙන් නිලධරයන් දෙදෙනෙකු පූර්ණකාලීනව සංගමයේ කටයුතු සඳහා මුදාහැරිය හැක. සාමාජිකයන් සංඛ්‍යාව 1000 ට අඩු එහෙත් 500 ට වැඩි රජයේ ලියාපදිංචි වෘත්තීය සමිතිවල වෘත්තීය සමිති කටයුතු සඳහා නිලධරයන් පූර්ණකාලීනව නිදහස් නොකරන අතර, එහි ප්‍රධාන නිලධරයෙකුට මසකට දින දෙකක උපරිමයකට යටත්ව එවන් කටයුතු සඳහා රාජකාරී නිවාඩු ලබා දිය හැක.

4.3 ඉල්ලීමක් අනුව වර්ෂ 4 ඉක්මවා මුදාහැරීමේ කාලය නිලධරයා අයත් දෙපාර්තමේන්තුව භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හා සේවයේ අවශ්‍යතාවන්ට යටත්ව වාර්ෂිකව දීර්ඝකළ හැකිය. එවැනි දීර්ඝ කිරීමක් සඳහා සංගමයකින් කෙරෙන සෑම ඉල්ලීමක් සමගම එම දීර්ඝ කිරීම සඳහා නිලධරයාගේ ලිඛිත එකඟත්වය තිබිය යුතුය.

4.4 මෙම අනුග්‍රහයන් දීම සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

ඒ අනුව, යම් නිලධාරියෙකු පූර්ණ කාලීන වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කළ යුතු වන්නේ අදාළ නිලධාරියා වෘත්තීය සංගම් නිලවරණයකින් පත්ව කරනු ලබන ඉල්ලීමකට අනුව වේ. එමෙන්ම අදාළ වෘත්තීය සමිතියේ සිටින සාමාජික සංඛ්‍යාව මත පූර්ණ කාලීනව නිලධරීන් කීදෙනෙකු නිදහස් කළ යුතුද යන්න තීරණය වේ. එහිදී 4 වන වගන්තිය ප්‍රකාරව සාමාන්‍යාධිකාරීවරයාගේ අනුමැතිය මත වසර 4 ක උපරිම කාලසීමාවක් සඳහා වාර්ෂිකව නිදහස් කිරීමට හැකිවන අතර, වසර 4 ඉක්මවා මුදාහැරීමේ කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලීම් කරන්නේ නම්,අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට සහ අදාළ විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව වාර්ෂිකව දීර්ඝ කිරීම කළ යුතු බව පෙනී යයි. එකී කාරණා ඉල්ලුම්කරු සහ දෙවන පාර්ශ්වය විසින් හබකිරීමකින් තොරවම පිළිගෙන ඇත. ඒ අනුව ඉල්ලුම්කරු පස්වන වසර සඳහා නිදහස් කිරීමට නීතිය ප්‍රකාරව බාධාවක් නොමැති නමුත්, දෙවන පාර්ශ්වය විසින් යම් හේතු කිහිපයක් මත මෙම දීර්ඝ කිරීම සිදුනොකරන ලද බව උත්තරවාද සහ සාක්ෂි විශ්ලේෂණයේදී අනාවරණය වී ඇත.

2022.02.13 වන දිනැති සටහන්, පී.ඩී. යූ. මාලක වික්‍රමසිංහ මහතා, 12-13 පිටු - හරස් ප්‍රශ්න

ප්‍ර: නිලවරණයකින් පත්වුණාට පසුව නේද ඔබ නිදහස් කිරීම ඉල්ලන්න ඕනේ ?

පි: ඔව්

ප්‍ර: සාක්ෂිකරු මම ඔබට යෝජනා කරනවා පූර්ණ කාලීන වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කරනකොට යම් නිලධාරියෙක්ව සාමාන්‍යාධිකාරීවරයාගේ අනුමැතිය මත උපරිමයෙන් වසර 4 ක කාලසීමාවක් සඳහා නිදහස් කිරීමට හැකියාවක් තිබෙනවා කියලා ?

පි: පිළිගන්නවා.

ප්‍ර: වසර 4 ඉක්මවන අවස්ථාවකදී සාක්ෂිකරු දන්නවාද මේ නිදහස් කිරීම කොහොමද කරන්නේ කියලා ?

පි: දන්නවා.

ප්‍ර: කොහොමද ඒක කරන්නේ ?

පි: අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දීලා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගන්නවා.

ප්‍ර: ඒ කියන්නේ සාක්ෂිකරු මේ මුදාහැරීමේ කාලය වසර 4 ඉක්මවෙනකොට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව සහ අදාල විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව වාර්ෂිකව මේ දීර්ඝ කිරීම කළ යුතුයි ?

පි: ඔව්.

ප්‍ර: මෙහි ක්‍රියාදාමය තමයි අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් හරහා වගඋත්තරකාර මණ්ඩලයට අන්තර්ග්‍රහනය කරලා තියෙන්නේ, මේ ක්‍රමවේදය තමයි දැනට ආයතනය තුළ යම් නිලධාරියෙක්ව පූර්ණ කාලීන වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කරන්න අනුගමනය කරන ක්‍රියාමාර්ගය කියලා කිව්වොත් ඔබ එය පිළිගන්නවාද ?

පි: ඔව්.

ආයතන සංග්‍රහයේ 4.3 වගන්තිය ප්‍රකාරව නිලධාරියෙකු වසර 4 ඉක්මවා වෘත්තීය සමිති කටයුතු සඳහා පූර්ණ කාලීනව නිදහස් කිරීමට හැකි බව කියනු ලබන අතරම රජයේ නිලධාරීන්ගේ සේවයේ අවශ්‍යතාව මත එකී අයිතිය ලැබිය හැක්කේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අදාළ විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව යනුවෙන් යම් සීමාවකට ලක්කර ඇත. කෙසේ නමුත්, වසර 4 ඉක්මවා දීර්ඝ කළ නොහැකි බවට නියත නැත. මන්දයත් අධ්‍යක්ෂ මණ්ඩලයට හෝ අමාත්‍යවරයාට අත්තනෝමතිකව කිසිදු සාධාරණ පදනමකින් තොරව එවැනි ඉල්ලීමක් ඉවත දැමිය නොහැකි බැවින් සහ මූලික අයිතිවාසිකමක් වශයෙන් වෘත්තීය සමිති කටයුතුවල නියැලීමට සේවකයෙකුට ඇති අයිතිය සහ වෘත්තීය සමිති නිලධාරියෙකුට අදාළ නෛතික රැකවරණය තවත් නීතින් ගණනාවක් මගින් තහවුරු කර ඇති බැවිනි.

- ***Constitution of Sri Lanka***
  *Article 14 (1) Every citizen is entitled to -*
  - *(c) the freedom of association*
  - *(d) the freedom to form and join a trade union :*
- ***Universal Declaration on Human Rights***
  *Article 23(4) Everyone has the right to form and to join trade unions for the protection of his interests.*
- ***International Labour Organization (ILO) Convention of Freedom of Association and Protection of the Right to Organise Convention, 1948 (No. 87)***

  *Article 2* — *Workers and employers, without distinction whatoever, shall have the right to establish and, subject only to the rules of the organization concerned, to join organisations of their own choosing without previous authorization.*

  *Article 3*

  *1. Workers' and employerd' organisations shall have the right to draw up their constitutions and rules, to elect their representatives in full freedom, to organise their administration and activities and to formulate their programmes.*

  *2. The public authorities shall refrain from any interference which would restrict this rights or impede the lawful exercise thereof.*

- 1935 අංක 14 දරන වෘත්තීය සමිති ආඥා පනත
- 1999 අංක 56 දරන කාර්මික ආරාවුල් (සංශෝධිත) පනත

විශේෂයෙන්, 1999 අක 56 දරන කාර්මික ආරවුල් (සංශෝධිත) පනතේ 32A වගන්තිය මගින් වෘත්තිය සමිතිවලට සේවා යෝජකයන් විසින් කරනු ලබන අසාධාරණ මැදිහත්වීම් පාලනයකර ඇති අතර, සේවකයෙකුට වෘත්තීය සමිතිවල කටයුතු කිරීමට ඇති අයිතිය නීතියේ සීමා ඇතුළත විශේෂ අයිතියක් ලෙස තහවුරු කර ඇත. ඒ අනුව, මේ සියලු නීති ප්‍රකාරව අවබෝධ කරගත හැකි කරුණක් වන්නේ වෘත්තීය සමිති කටයුතු කිරීමෙහි ඇති වැදගත්කම සහ මූලික අවශ්‍යතාවය අතිශය සාධාරණ හා විනිවිද හේතුවකින් තොරව බැහැරකළ නොහැකි බවයි.

ඉහත කී පරිදි ආයතන සංග්‍රහයේ 4.3 වන වගන්තිය ප්‍රකාරව කොන්දේසි 2ක් සපුරාලිය යුතුය. එක් අතකින් දෙපාර්තමේන්තු භාර අමාත්‍යවරයාගේ එකඟත්වය සහ අනෙක් අතට සේවයේ අවශතාවයයි. මෙම ආරාවුල තුළ අමාත්‍යවරයාගේ අනුමැතිය සම්බන්ධව ගැටළුවක් නොමැති නමුත්, සේවයේ අවශ්‍යතාව තීරණය කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය බැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව යන කාරණය ඉස්මතු වේ. අධ්‍යක්ෂ මණ්ඩල විසින් සේවයේ අවශ්‍යතාව යන්න මත ඉල්ලුම්කරු විසින් කරන ලද මුදාහරීමේ ඉල්ලීම බැහැර කළ බවට කිසිවිටක ප්‍රකාශකර නොමැත, එසේ නම් සේවා අවශ්‍යතාව පිළිබඳ ගැටළුවක් නොමැති බැවින් දෙවන පාර්ශ්වයේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉල්ලුම්කරුගේ එකී ඉල්ලීම බැහැර කළ නොහැක. කරුණු එසේ තිබියදී, දෙවන පාර්ශ්විය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අදාළ ඉල්ලීම බැහැර කිරීමේ තීරණයට එළඹි ආකාරය පිළිබඳ හා එහි විනිවිදභාවය සම්බන්ධව පළමු පාර්ශ්වය විසින් නිරතුරුව කරුණු ගෙනහැර ඇත. තවද, දෙවන පාර්ශ්වය විසින්ම වෙනත් සාක්ෂි ඔස්සේ පිළිගත් පහත සඳහන් සිය ක්‍රියාපිළිවෙත් මතම ඔවුන් සාධාරණ පදනමකින් තොරව කටයුතු කර ඇති බව ප්‍රතික්ෂේප කළ නොහැක.

අ. ඉල්ලුම්කරු මෙන්ම සමකාලීනව ඉල්ලීම්කළ ඇතැම් සේවකයින් වසර 4 ඉක්මවා පූර්ණකාලීනව නිදහස්කර තිබීම

ඉල්ලුම්කරුට අනුව, තමත් 2019 වසරේදී අඛණ්ඩ 5 වන වසර වෙනුවෙන් පූර්ණ කාලීන නිදහස් කිරීමක් සඳහා අනුමැතිය ඉල්ලා සිටියදී එකී ඉල්ලීම් බැරකළද, එම දෙවන පාර්ශ්වය විසින්ම 2019 වසරේදී අඛණ්ඩව 10 වන වසරටත් පූර්ණ කාලීන නිදහස් කිරීමක් අයැද සිටි විදුලි සේවක සංගමයේ ප්‍රධාන ලේකම් වශයෙන් කටයුතු කළ රංජන් ජයලාල් මහතාහට ඊට අනුමැතිය ලබාදී ඇත. එසේ රංජන් ජයලාල් මහතාහට දීර්ඝ කිරීම ලබාදෙන ලද්දේ අදාළ සංගමයේ සාමාජිකයන් සංඛ්‍යාව 5000 ඉක්මවන බැවින් යන්න ප්‍රකාශ කරමින් පළමු පාර්ශ්වයේ සාමාජිකයින් 3000 නොඉක්මවීම ඉල්ලුම්කරු නිදහස් නොකිරීමට හේතුවූ බවට සාක්ෂි ලබාදී ඇත. කෙසේ වුවද, දෙවන පාර්ශ්වයේ පළමු ප්‍රකාශයේ හෝ දෙවන ප්‍රකාශයේ පළමු පාර්ශ්වයේ සාමාජිකයන් සංඛ්‍යාව සම්බන්ධයෙන් කිසිදු සම්ප්‍රකාශයක් ඉදිරිපත්කර නොමැත. ඉල්ලුම්කරුගේ 5වන වසර සඳහා දීර්ඝ කිරීමේ ඉල්ලීම ඉවත දැමීමට හේතු වී ඇත්තේ මැතිවරණ කොමසාරිස්තුමන් විසින් 2019.10.09 දිනැතිව නිකුත් කළ ලිපිය බවට එහි සඳහන් වේ. සාක්ෂි විභාගයේදී පමණක් එවැනි හේතුවක් පළමු වරට ඉදිරිපත්කර ඇත.

2023.12.15 වන දිනැති සටහන්, මානව සම්පත් නිලධාරී මජීඩ් මොහොමඩ් සමීල් මහතා, 14-15 පිටු - වැඩිදුර හරස් ප්‍රශ්න (බේරුම්කරණයෙන්)

ප්‍ර: පළමු පාර්ශ්වයෙන් ප්‍රශ්න කළේ රංජන් ජයලාල් මහත්මයා 10 වන වසරටත් නිදහස් කරනවා. මාලක වික්‍රමසිංහ මේ ඉල්ලුම්කරු 5 වන වසරට නිදහස් කරන්න කියලා ඉල්ලන්නනේ. 5 වන වසරට ඔහු නිදහස් කරන්න බැහැ කියලා අධ්‍යක්ෂ මණ්ඩලය කියන අතරේ රංජන් ජයලාල් මහත්තයා 10 වන වසරට නිදහස් කරනවා නේද? මේ දෙකේ තියෙන පරස්පරය පැහැදිලි කරන්න කියලා තමයි කියන්නේ.

පි: රංජන් ජයලාල් මහත්තයාගේ වෘත්තීය සමිතියේ සාමාජිකයින් 5000කට වැඩියි. ප්‍රධානීන් කියලා තියනවා වෘත්තීය සමිති අයගෙන් දෙන්නෙක් මුදා හරිනවා නම් 3000 කට වැඩි සාමාජිකයින් සංඛ්‍යාවක් තියෙන්න ඕනේ. ඒ නිසා විදුලි සේවක සංගමයේ නිදහස් කිරීම සම්බන්ධයෙන් සාමාජිකයන් සංඛ්‍යාවේ කිසිම ගැටළුවක් තිබුනේ නැහැ.

ප්‍ර: ඒ කාගේ එකද?

පි: විදුලි සේවක සංගමය රංජන් ජයලාල් මහත්තයාගේ.

ප්‍ර: ඒකේ නම මොකද්ද?

පි: විදුලි සේවක සංගමය. මාලක වික්‍රමසිංහ මහත්තයාගේ විදුලි පොදු සේවක සංගමයේ සාමාජිකයින් 3000කට අඩු නිසා ඒ රිලීස් කරන දෙන්නෙක් රිලීස් කරන්න තියෙන ප්‍රශ්නය නිසා ස්වාමීනි මේ අනුගමනය කරන්න අපිට වුනේ.

අනෙක් අතට ඉල්ලුම්කරුගේ මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශය සමග ලකුණුකර ඇති A60 දරන ලේඛනය මගින් නිදහස් සේවක සංගමයේ ආර්.ජී.අයි.යූ විජේවික්‍රම මහතා පස්වන වර්ෂය සඳහා 2019 වර්ෂයේදීම පූර්ණ කාලීනව නිදහස් කිරීම අනුමතකර ඇතිබව ප්‍රකාශකර ඇත. ඒය දෙවන පාර්ශ්වය විසින්ද පිළිගෙන ඇත.

අදාළ මුදාහැරීම් සිදුකරන ලද්දේ එකී වෘත්තීය සංගමයේ සාමාජික සංඛ්‍යාව සපුරා ඇති බැවින් යන්න එකී නිදහස් කිරීමට හේතු වූ බව දෙවන පාර්ශ්වය විසින් දක්වා ඇති නමුත්, විවිධ සාක්ෂි පරස්පරතා හමුවේ වෘත්තීය සමිතියේ සංඛ්‍යාව සම්බන්ධව විධිමත් සාක්ෂියක් ගෙන ඒමට පවා දෙවන පාර්ශ්වය අපොහොසත්ව ඇත. එසේ හෙයින්, පළමු පාර්ශ්වීය වෘත්තීය සමිතිය හා ඉල්ලුම්කරු දෙවන පාර්ශ්වය තුළ වෙනස් කොට සැලකීමට ලක්ව ඇති බව පෙනී යයි.
වෘත්තීය සංගම් විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක වන දෙවන පාර්ශ්වය තුළ විනිවිද පෙනෙන සුළු සාධාරණ හේතුවකින් තොරව එකම නීතිය වෘත්තීය සමිතියෙන් සමිතියට වෙනස් විය නොහැක. නිලධාරියාගෙන් නිලධාරියාට වෙනස් නොවිය යුතුය. 2019 වර්ෂය තුළ දෙවන පාර්ශ්වයේ වෘත්තීය සංගම් 4 ක නිලධාරීන් පූර්ණකාලීනව නිදහස්කර ඇති බවට දෙවන පාර්ශ්වයේ සාක්ෂිකරු තහවුරු කර ඇත. පූර්වාදර්ශයක් වේ නම් සමාන සාධක තුළ එය අනුගත කර ගැනීමේ බාධාවක් නොමැත.

ආ. පළමු පාර්ශ්වීය වෘත්තීය සමිතියෙන් වෙනත් නිලධාරියෙකු පූර්ණකාලීනව නිදහස් කිරීමට යෝජනා කරන ලෙස දෙවන පාර්ශ්වය විසින් දන්වා තිබීම

දෙවන පාර්ශ්වය විසින් ලකුණු කර ඇති R7 දරන ලේඛනය මගින් ඉල්ලුම්කරුගේ පස්වන වර්ෂය සඳහා වන මුදාහැරීම බැහැර කළ බව දන්වන ලද අතරම, ඒ වෙනුවට වෙනත් නිලධාරියෙක් නම් කරන ලෙසත් දන්වා ඇත. ඒ වනවිටත් 2019 වර්ෂය දක්වා පළමු පාර්ශ්විය වෘත්තිය සමිති ලේකම්ද නිදහස්කර තිබූ අතර, තවත් නිලධාරියෙක් නම් කරන ලෙස දක්වා තිබීම මගින් දෙවන පාර්ශ්වය පළමු පාර්ශ්වීය වෘත්තීය සමිතියේ සාමාජිකයින් ගණන 3000 ඉක්මවන බවට පිළිගැනීමෙන් ප්‍රතිබන්ධනය වී ඇත. ඒ අනුව, දෙවන පාර්ශ්වය විසින් ඉල්ලුම්කරුගේ ප්‍රස්තුත ඉල්ලීම බැහැර කිරීමට ගත් තීරණය සාධාරණීකරණය කළ නොහැක.

2023.10.16 වන දිනැති සටහන්, මානව සම්පත් නිලධාරී මජීඩ් මොහොමඩ් සමීල් මහතා, 2 පිටුව - වැඩිදුර මූලික සාක්ෂි

ප්‍ර: ඇයි සාක්ෂිකරු වෙනත් නිලධාරි මහතෙක් පත්කරලා එවන්න කියලා තිබෙන්නේ?

පි: මෙතන අදහස් වුණේ වෙන නිලධාරි මහතුන් ඉල්ලුම් කළොත් එතුමාව පළවන වසරට නිදහස් කිරීම. ඒ නිදහස් කිරීම මණ්ඩලයේ අනුමැතිය ගන්න ඕනේ නැහැ. ඇතුළෙම ඉන්න සාමාන්‍යාධිකාරී විසින් ඒ තීරණය ගන්න පුළුවන් කියන පදනම මත තමයි ඒ දැනුම් දීම දීලා තිබුනේ.

අනෙක් අතට, උත්තරවාදවල තොමැති කරුණක් ලෙස මුල්වරට දෙවන පාර්ශ්වයේ සාක්ෂිකරු සාක්ෂි ලබාදීමේදී පමණක් මෙම වෘත්තීය සමිතියට 3000 ඉක්මවන සාමාජික සංඛ්‍යාවක් නොමැති බවට සහ 1844 පමණක් සිටින බවට සාක්ෂි ලබාදී ඇත. 2017 වර්ෂයේ සිට පැවති HRIS දත්ත පද්ධතිය යාවත්කාලීනව නිවැරදිව පවත්වාගෙන ගියේ නම්, මෙම වෘත්තීය සමිතියට නිලධාරීන් දෙදෙනෙකු පූර්ණකාලීනව නිදහස් කිරීමට දෙවන පාර්ශ්වය කිසිසේත් ඉඩනොදෙනු ඇත. විධිමත් සාක්ෂිමය වටිනාකමක් සහිත සංඛ්‍යා ලේඛනයක් ඉදිරිපත් කිරීමට නොහැකි බව දෙවන පාර්ශ්වීය සාක්ෂිකරු විසින්ම පිළිගෙන ඇත. R21 දරන සංඛ්‍යා ලේඛනය වෙත අවධානය යොමු කළහොත්, එකී දත්ත කිනම් දිනයක් වනවිට පවතින දත්තද අවසන් වරට යාවත්කාලීන කළ දිනය කුමක්ද යන්න පිළිබඳ කිසිදු සඳහනක් නොමැති සේම එකී ලේඛනය සාක්ෂිකරු විසින් අත්සන් කළ දිනයක් හෝ නොමැත. එසේම, එම සංගමයේ සාමාජික සංඛ්‍යාව පිළිබඳ පරස්පර විරෝධී සාක්ෂි ලබාදීම තුළ සාක්ෂිකරුගේ සාක්ෂිවල විශ්වාසනීයත්වයද අභියෝගයට ලක්වේ.

2023.10.16 වන දිනැති සටහන්, මානව සම්පත් නිලධාරී මජීඩ් මොහොමඩ් සමීල් මහතා, 16-19 පිටුව - හරස් ප්‍රශ්න

ප්‍ර: ලංකා විදුලිබල මණ්ඩලයේ HRIS පද්ධතිය ස්ථාපිත කළේ මොන වසරේද ?

පි: මේ පද්ධතිය 2017 වසරේ සිට අපි HRIS සිස්ටම් එක ක්‍රියාත්මක වුණා. එකපාරටම නෙමෙයි අදියරෙන් අදියර 2017 සිට.

ප්‍ර: මහත්මයා කියන විදියට ඔය පද්ධතිය හඳුන්වලා දීලා විදුලිබල මණ්ඩලයට පියවරෙන් පියවර කරගෙන ගිහිල්ලා ඒක අංගසම්පූර්ණ වුනේ කවදද?

පි: අංග සම්පූර්ණයි කියලා කියන් බැහැ අපිට. අපි වරින් වර ඒ තිබෙන ඩිමාන්ඩ් අනුව ඒ කියන්නේ ඉල්ලීම් අනුව අපි යම්කිසි මොඩිපිකේෂන් කරනවා.

ප්‍ර: ඒ කියන්නේ දත්ත වරදින්න පුළුවන්

පි: ඒ වෙලාවේ තිබුණු දත්ත මේ.

ප්‍ර: මේ වෘත්තීය සමිතියේ කීයක් 2019 සංඛ්‍යා ලේඛන දත්ත අනුව කොච්චර සාමාජික සංඛ්‍යාවක් ඉඳලා තිබෙනවාද?

පි: 1844යි

ප්‍ර: මේ වෘත්තීය සමිතියේ 2019 වෙනකොට කව්රු හරි නිදහස් කරලා හිටියද?

පි: තව එකකෙනෙක් මුදා හැරලා තිබුණා

ප්‍ර: එයා ඒ වෙනකොට සේවයෙන් නිදහස් වෙලා හිටියේ?

පි : ඔව්

ප්‍ර : හැබැයි අධ්‍යක්ෂ මණ්ඩලයේ ඔය ලියපු ලිපියකවත් සාක්ෂිකරුගේ පාර්ශ්වයෙන් ලකුණු කළානේ ලිපි ගණනාවක්, ඒ ලිපිවල කොහේවත් කියලා නැහැනේ සාමාජික සංඛ්‍යාව නිසා මේ දෙවෙනියව නිදහස් කරන්න බැහැ කියලා තිබෙනවාද?

පි: R14 ලේඛනය බේරුම්කරණයට පෙන්වා සිටි

ප්‍ර: 2019 මේ ආරාවුල ඇති වන මොහොත වනවිට ලංකා විදුලි පොදු සේවක සංගමයේ කීදෙනෙක් නිදහස් කරලා තිබුණද පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා?

පි: 2ක් මුදා හැරලා තිබුණා. එක්කෙනෙක් එවකට හිටපු ලේකම් කසුන් බොතේජු කියලා බේරුම්කරු

ප්‍ර : ඊලඟ එක්කෙනා කවුද?
පි : මාලක වික්‍රමසිංහ මහතා
ප්‍ර : ඉල්ලුම්කරුගේ ඉල්ලීම 2019 දක්වා වලංගුයි?
පි : ඔව්
ප්‍ර : කවදද ඉවර වෙන්නේ නිදහස් කිරීම?
පි : 2019.08.15 දක්වා
ප්‍ර : මහත්මයාගේ R21 වාර්තාව කවදා ගත්ත එකක්ද?
පි : මේක පද්ධතියේ තිබුණේ. 2019 අවුරුද්දේ අපි මේක ඩවුන්ලෝඩ් කළා කීදෙනෙක් ඉන්නවද කියලා එක එක යූනියන්වල. බොඩ් ජේපර් දාන අවස්ථාවේදී තමයි මේ දත්ත එක්සෙප්ට් කළේ. ජේපර් එකට සම්බන්ධ කරන්න ඕනේ හින්දා තොරතුරු අපිට අනිවාර්යෙන් ඕනා. ඒ වෙලාවේදි තමයි මේක එක්සේප්ට් කලේ.
ප්‍ර : මහත්මයාට මම යෝජනා කරනවා මහත්මයාගේ මේ පද්ධතියයි කියන එක කොතරම් දෝෂ සහගතද කිලා කිව්වොත් පද්ධතියේ තොරතුරු ලබාගන්නා දිනයවත් ඒ පද්ධතියේ සටහන් වෙන්නේ නැති පද්ධතියක් මහත්මයාට තිබෙන්නේ?
පි : HRIS සිස්ටම්වල යම්කිසි අඩුපාඩු තිබෙන්න පුළුවන්. නමුත් මේක හරි එක්සෙප්ට් බලනවා නම් එතන තියන ඒ ඩේටා අනුව මේක කවදද දිනය කවදද කීදෙනෙක් සිටියද කියන එක හරියට බලන්න ඕනේ නම් HRIS තිබෙනවා ලයිසන්ස් එකක් එතන අයිටී බ්‍රාන්ච් එකෙන් කතා කරලා තමයි මේකේ වෙරිපිකේෂන් එක ගන්න පුළුවන්
ප්‍ර : මහත්මයා දැන් R21 කියලා සලකුණු කරපු ලේඛනය කිසිදු සාක්ෂිමය වටිනාකමක් නැති මහත්මයාගේ හිතළු ලේඛනයක් කියලා මම යෝජනා කරනවා?
ප්‍ර එක පිළිගන්න බැහැ මේක සිස්ටම් එකෙන් ලබාගත්ත තොරතුරු

ප්‍ර: ඒ අනුව මහත්මයාගේ සාක්ෂියෙන්ම ඉතා පැහැදිලි වෙනවා සාමාජිකයන් සංඛ්‍යාව 3000 කට වැඩිය ඒ මොහොතේත් ඉඳලා තිබෙන නිසා තමයි නිලධාරීන් 2ක් පූර්ණකාලීනව නිදහස් කලේ කියන එක මහත්මයාගේ සාක්ෂියෙන්ම තහවුරු වෙනවා නේද?
පි: තහවුරු වෙනවා

II. කරුණු එසේ හෙයින්, පිළිගත් නීතමය තත්වය යටතේ ඉල්ලුම්කරු 2019.08.15 සිට 2020.08.14 දක්වා වන 5 වන වසරටත් පූර්ණ කලීනව වෘත්තීය සමිති කටයුතු වෙනුවෙන් නිදහස් කිරීමට නෛතික බාධාවක් නැත.

වසර 4 ඉක්මවූ පසුබිමක තවත් වසරක් සඳහා ඉල්ලුම්කරු නිදහස් කිරීමට හැකියාව පැවතියදී එසේ නිදහස් නොකිරීමට අදාළ හේතු මොනවාද?

පස්වන වසර සඳහා ඉල්ලුම්කරු වෘත්තීය සමිති කටයුතු වෙනුවෙන් පූර්ණකාලීනව නිදහස් කිරීම ප්‍රතික්ෂේප කිරීමට පැවති හේතු ලෙස දෙපාර්ශවය විසින්ම හේතු ගණනාවක් ඉදිරිපත්කර ඇත. එකී හේතු කාරණා එකිනෙක විමසා බලමි.

දෙවන පාර්ශ්වයට අනුව නිදහස් නොකිරීමට හේතු වූ කරුණු

අ. 2019.10.09 දිනැති මැතිවරණ කොමිෂන් සභාව මගින් නිකුත් කල ලිපිය

පළමු පාර්ශ්වය විසින් 2019.07.23 දිනැති ලිපියෙන් (A9) කරන ලද ඉල්ලීම මත මෙම ඉල්ලුම්කරු පූර්ණ කාලීන වෘත්තීය සමිති කටයුතු සඳහා 2018.08.15 දින සිට 2019.08.14 දක්වා (සිව්වන වසර සඳහා) නිදහස් කිරීමට 2019.09.24 දිනැති AIO ලිපිය මගින් අනුමැතිය ලබාදී ඇති බව සඳහන් කරන අතර, පස්වන වසර සඳහා අනුමැතිය ලබාදී නොමැති බවට සඳහන් කර ඇත. ඒ අනුව 2019.09.24 දිනට අධ්‍යක්ෂ මණ්ඩල තීරණය දැනුම් දී තිබියදී 2019.10.12 දිනැති මැතිවරණ කොමිෂන් සභාව මගින් නිකුත්කල ලිපියක් (A22) මගින් එකී තීරණයට බලපෑම් කරනුයේ කෙසේද. A22/R17 දරන ලිපිය ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව කිසිදු විටක ඉල්ලුම්කරු පස්වන වර්ෂය සඳහා පූර්ණකාලීනව මුදාහැරිය නොහැකි බවට දන්වා නොමැත. කෙසේ වෙතත්, එහි සඳහන් වන්නේ ජනාධිපතිවරණය පැවැත්වෙන 2019.11.26 තෙක් පමණක් තාවකාලිකව පූර්ණකාලීනව නිදහස් කිරීම අත්හිටවනු මිස ස්ථිරව 2019-2020 වර්ෂය පුරාවට අත්හිටවීමක්ද නොවේ.

කරුණු එසේ වුවද 2019.07.23 දිනැති ලිපියෙන් (A9) කරන ලද ඉල්ලීමට පිළිතුරු දීම මාස ගණනකින් ප්‍රමාද කර වෙනත් බාහිර සාධක පාදක කරගෙන සිතාමතා ඉල්ලුම්කරු නිදහස් නොකර සිටීමටත්, මැතිවරණ දිනයට පසුවද එකී ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබැලීමටත් පියවර ගෙන ඇතැයි පෙනී යයි. මේ කරුණු වඩාත් තහවුරු වන්නේ 2019.04.24 දිනැති ඉල්ලීමකට 2019.05.24 දිනැතිව පිළිතුරු දෙමින් A59 ලිපිය මගින් නිදහස් සේවක සංගමයේ නිලධාරියෙකු පූර්ණ කාලීනව නිදහස් කිරීම සහ 2019.05.13 දිනැති ඉල්ලීමකට 2020.02.26 දිනැතිව පිළිතුරු දෙමින් A60 ලිපිය මගින් ලංකා විදුලි සේවක සංගමයේ නිලධාරියෙකු පස්වන වසර සඳහා පූර්ණකාලීනව නිදහස් කිරීම යන කාරණා ද්විත්වයෙකි

ආ. පළමු පාර්ශ්විය වෘත්තිය සමිතියේ සාමාජික සංඛ්‍යාව

ආයතන සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව යම් වෘත්තීය සමිතියක නිලධාරියෙකු පූර්ණ කාලීනව නිදහස් නම් අදාළ සාමාජිකයන් ගණන පිළිබඳ නිර්නායකය තෘප්ත කළ යුතු බව පැහැදිලිව සඳහන් වේ. ඒ අනුව. පළමු පාර්ශ්විය වෘත්තීය සමිති සාමාජිකයන් ගණන 3000 ඉක්මවන හෙයින් නිලධාරීන් දෙදෙනෙකු පූර්ණකාලීනව නිදහස් කළ හැක. එසේම, සාමාජිකයන් 3000 ඉක්ම වූ වර්ෂයේ සිට නිලධාරීන් දෙදෙනෙකු පූර්ණකාලීනව නිදහස් කළ බවත්, 2019 වර්ෂයේද නොවැම්බර් තෙක් ලේකම්වරයා නිදහස් කර තිබූ අතර. සභාපති වන ඉල්ලුම්කරු වෙනුවට වෙනත් නිලධාරියෙකු නම් කරන ලෙසත් දන්වා තිබීම තුළින් නිලධාරීන් දෙදෙනෙකු නිදහස් කර තිබිය යුතු බව දෙවන පාර්ශ්වය විසින් පිළිගෙන ඇත.

කරුණු එසේ තිබියදී, සාක්ෂි විභාගයේදී දෙවන පාර්ශ්වයේ සාක්ෂිකරු එකිනෙකට පරස්පර සාක්ෂි ඉදිරිපත් කරමින් වෘත්තීය සමිතියේ සාමාජිකයන් සංඛ්‍යාව තහවුරු කරගත නොහැකි බවට විවිධ කරුණු ගෙනහැර දක්වා ඇත. එසේම. මෙම වෘත්තිය සමිති සාමාජික සංඛ්‍යාව පිළිබඳ ගැටළුව මතු කරනු ලබන්නේද දෙවන පාර්ශ්වයට එරෙහිව ඉල්ලුම්කරු විසින් වෘත්තීය සමිතිය සමග එක්ව CA/WRIT/193/15 දරන නඩුවේ තීන්දුව (A7) 2019.04.02 වන දින ප්‍රකාශයට පත් කරමින් සර්ෂියෝරාරි රිට් ආඥාවක් නිකුත් කිරීමත් සමග ඉල්ලුම්කරු පස්වන වසර සඳහා මුදාහරින ලෙස කරන ලද ඉල්ලීම ප්‍රකාර සකස්කළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව තුළින්ය. එසේ හෙයින්, සාමාජික සංඛ්‍යාව හේතු පාදක කරගැනීම විමතියට කරුණකි.

දෙවන පාර්ශ්විය සාක්ෂිකරු ප්‍රකාශ කර සිටින්නේ වෙනත් වෘත්තීය සමිති විසින් වාචිකව කරන ලද පැමිණිලි මත පළමු පාර්ශ්වීය සමිතියේ සාමාජික සංඛ්‍යාව පිළිබඳ ගැටළුව හටගත් බවයි. කෙසේ නමුත්, ලිඛිත සාක්ෂි තිබේද යන්න ඇසීමට ප්‍රථම ඔහු විසින් වාචිකව පමණක් පැමිණිලි කර ඇති බවට පවසයි. ඔහුට ඒ සම්බන්ධයෙන් පිළිගත් සාක්ෂියක් ඉදිරිපත් කළ නොහැකි වීමෙන් සාක්ෂියේ ඇති විශ්වාසනීයත්වය පිළිබඳ ගැටළුවක් ඇත. අනෙක් අතට, වෘත්තිය සමිති 21කගේ අත්සනින් යුතුව ඉල්ලුම්කරු පස්වන වර්ෂය සඳහා නිදහස් නොකිරීම හෙළා දකිමින් යවන ලද A30 දරන ලිපිය ප්‍රකාරව බහුතර වෘත්තීය සමිති වලට ඉල්ලුම්කරු පූර්ණ කාලීනව නිදහස් කිරීම ගැටළුවක් වී නොමැත. එසේම සාමාජිකයින් ගණන පිළිබඳ මුල්වරට පැමිණිලි කරන්නේ 2018 වර්ෂයේ යැයි කියා තිබුණද, සාමාන්‍යාධිකාරී එවකට අනුමැතිය ලබාදී තිබීමත්, 2019 වර්ෂයේ ඉල්ලුම්කරු සම්බන්ධ ගැටළුව පැමිණි පසු පමණක් ඊට ප්‍රතිචාර දක්වමින් සාමාජික සංඛ්‍යාව හේතු කරගෙන ඉල්ලුම්කරු නිදහස් නොකිරීමත් විමතියකි.

2023.07.17 වන දිනැති සටහන්, මානව සම්පත් නිලධාරී මජීඩ් මොහොමඩ් සමිල් මහතා, 20 පිටුව - මූලික සාක්ෂි

ප්‍ර : කුමක්ද ගැටළුව

පි : මෙම වෘත්තීය සමිතිය ගැන ආපු ගැටළුව ඒ වේලාවේදී දෙදෙනෙක් නිදහස් වෙලා හිටිය අනිත් වෘත්තීය සමිති සාමාජිකයන් පරිපාලන නිලධාරීන් ගාවට ඇවිත් ප්‍රශ්න කළා ලංකා විදුලි පොදු සේවක සංගමයේ සාමාජිකයින් 3000ක් කියලා නිලධාරීන් 2 ක් නිදහස් වෙලා තිබුනා 3000 කියලා කෙසේද තහවුරු කළේ කියලා. එය අපිට 2018 සිට අපිට මෙම ප්‍රශ්නය ආවා. ඒ දවස්වල අපි සාමාන්‍යාධිකාරිගේ අනුමැතිය අනුව කළේ 2018 මෙම ප්‍රශ්නය ආවාම 2019 අපි තීරණය කළා. වෘත්තීය සමිති සාමාජිකයින් ඒ අය පුද්ගලික ලිපිගොනුව හරහා මානව සම්පත් තොරතුරු පද්ධතිය ඇතුළත් කරන්න කියලා. අපි ඒ සම්බන්ධයෙන් සියලුම ඩී.ජී. අයට දැනුවත් කළා තමන්ගේ සාමාජිකයින් මානව සම්පත් තොරතුරු පද්ධති හරහා ඇතුළත් කරන්න කියලා.

2023.07.17 වන දිනැති සටහන්, මානව සම්පත් නිලධාරී මජීඩ් මොහොමඩ් සමිල් මහතා, 22 පිටුව - මූලික සාක්ෂි (බේරුම්කරණයෙන්)

ප්‍ර : මෙම ඉල්ලුම්කරු නිදහස් කිරීම සම්බන්ධයෙන් තවත් ගැටළුවක් තිබුණාද?

ප්‍ර : අපිට යම්කිසි වෘත්තීය සමිති කිහිපයක් ඇවිත් පැමිණිලි කරලා තිබෙනවා සාමාජිකයන් 3000ට වැඩි නැහැ කියලා

පි : ඔය කියන පැමිණිල්ල ඔබටද කළේ?

ප්‍ර : මගෙන් ප්‍රශ්න කළා. මගෙන් වාචිකව තමයි ප්‍රශ්න කර තිබේන්නේ. ඊට අමතරව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගෙන් අනින් වෘත්තීය සමිති වාචිකව ප්‍රශ්න කර තිබෙතවා.

එසේම, දෙවන පාර්ශ්වයේ සාක්ෂිකරු පළමු පාර්ශ්වීය වෘත්තීය සමිති සාමාජිකයන් ගණන R12 ලේඛනය මත පදනම්ව 1844 බැවින් පූර්ණකාලීනව නිලධාරීන් එක අයෙකු පමණක් නිදහස් කළ හැකියි කියා පවසන සාක්ෂිය ඔහු විසින්ම පරස්පරයට ලක්කර ඇත. මන්දයත්, ඔහුගේ එකී ලේඛනයේ දැක්වෙන වෘත්තීය සමිතිවල සාමාජිකයන් ගණනට අනුව පූර්ණකාලීන වෘත්තිය සමිති කටයුතුවල යෙදෙන අනෙක් සංගම් 3හි සිටින සාමාජිකයන් ගණනට වඩා පූර්ණකාලීනව නිලධාරීන් වැඩිපුර සංඛාවක් නිදහස්කර තිබෙන බවට ඔහුගේ සාක්ෂියෙන් හෙළිකර තිබීමයි.

2023.12.15 වන දිනැති සටහන්, මානව සම්පත් නිලධාරී මජීඩ් මොහොමඩ් සමීල් මහතා, 9 පිටුව-වැඩිදුර හරස් ප්‍රශ්න

ප්‍ර: මහත්මයා ඔය ලංකා විදුලිබල මණ්ඩලයේ තිබෙන විශාල වෘත්තිය සමිති සංඛ්‍යාවක් අතුරින් වෘත්තීය සමිති කීයකටද මේ අවස්ථාව පූර්ණකාලීනව නිලධාරීන් නිදහස් කිරීමට අවස්ථාව ලබාදීලා තිබුනේ ?

පි: ඒ අවස්ථාවේ වෘත්තිය සමිති 4ටයි අවස්ථාව ලබාදීලා තිබුනේ

ප්‍ර: මහත්මයාට නම් වශයෙන් මතකද?

පි: ඔව් විදුලි සේවක සංගමය වෘත්තිය සමිතිය වෙනුවෙන් දෙන්නෙක්. ජාතික සේවක සංගමය වෙනුවෙන් එක්කෙනෙකුයි, නිදහස් සේවක සංගමය වෙනුවෙන් දෙන්නෙකුයි, පොදු සේවක සංගමයෙන් දෙන්නෙකුයි.

2023.12.15 වන දිනැති සටහන්, මානව සම්පත් නිලධාරී මජීඩ් මොහොමඩ් සමීල් මහතා, 12 පිටුව- හරස් ප්‍රශ්න

ප්‍ර: ලංකා විදුලි සේවක සංගමයට සාමාන්‍ය සාමාජිකත්වය කීයක් තියෙනවාද මේ අවුරුද්ද වන විට?

පි: 5000කට වැඩි

නමුත් සාක්ෂිකරුගේ සාක්ෂිය නිවරදි නම් R12 ලේඛනය අනුව,

විදුලි සේවක සංගමයේ සාමාජිකයන් ගණන -R12 ඇමුණුම සම්පූර්ණ නැත<br>
ජාතික සේවක සංගමයේ සාමාජිකයන් ගණන - 751 කිසිවෙක් නිදහස් කළ නොහැක (1500 අඩු බැවින්)<br>
නිදහස් සේවක සංගමයේ සාමාජිකයන් ගණන - 2329 - එක් අයෙකු පමණක් නිදහස් කළ හැක (3000ට අඩු බැවින්)<br>
පොදු සේවක සංගමයේ සාමාජිකයන් ගණන 1844 - එක් අයකු පමණක් නිදහස් කළ හැක (3000ට අඩු බැවින්)

ඒ අනුව ගම්‍ය වන්නේ, දෙවන පාර්ශ්වය නිසි සංඛ්‍යා දත්ත පවත්වාගෙන යමින් නිවැරදි නිලධාරීන් ගණන පූර්ණකාලීනව නිදහස් කර ඇති නමුත්, පළමු පාර්ශ්වය සමග පවතින ආරාවුල නිසාවෙන් නිවැරදි සංඛ්‍යා දත්ත ඉදිරිපත් නොකරනවා විය හැකි බවයි.

2023.12.15 වන දිනැති සටහන් මානව සම්පත් නිලධාරී මජීඩ් මොහොමඩ් සමීල් මහතා, 15-16 පිටු- වැඩිදුර හරස් ප්‍රශ්න

ප්‍ර: ආර් 21 කියන ලේඛනය මහත්තයා විශ්වාස තබන සාමාජික සංඛ්‍යාව ඇතුලත් ලේඛනය නොවේ නේද?

පි: ඔව්

ප්‍ර: එතකොට ඒ ලේඛනය කවදා මහත්තයාගේ පද්ධතියෙන් ගත්තාද කියලා මම පසු ගිය දින ඇහුවාම මේ ලේඛනයේ එහෙම එකක් සඳහන් නැහැ කියලා පිළිගත්තා නේද?

පි: මම දිනයක් කිව්වා 2019 වසරේ සැප්තැම්බර් 11 වන දින

ප්‍ර: 2019.09.11 දින කියලා?

පි: ඔව්

ආර් 21 ලේඛනය පෙන්වා සිටි

ප්‍ර: මේක මහත්තයා අතින් ලියපු එකක් නේද?

පි: ඔව් මේක මම අතින් ලිව්වේ

ප්‍ර: මහත්තයා මේක අතින් ලියලා නොවේ මහත්තයා මේක පද්ධතියෙන් ගත්තාය කියලා මහත්තයාට තහවුරු කරන්න අහවල් දින ගත්තාය කියලා තහවුරු කරන්න හැකියාවක් තියෙනවාද මහත්තයා අතින් ලියන එකට හැර?

පි: හැකියාව තියෙන්නේ ස්වාමිනි අදාළ අයිටී ඩිපාර්ට්මන්ට් එකට ඉල්ලීමක් කරලා ඒ අයිටී ඩිපාර්ට්මන්ට් එකෙන් තමයි.

බේරුම්කරණයෙන්

ප්‍ර: මේ අවස්ථාවේදී පුලුවන්ද?

පි: මේ අවස්ථාවේදී බැහැ

ප්‍ර: පසුගිය දින කිව්වා අද දින ඇවිත් එය තහවුරු කරනවා කියලා. එයට අද දින සූදානමින්ද ආවේ?

පී: නැහැ මමම එහෙම එකක් කිව්වේ නැහැ ස්වාමිනි

2023 12.15 වන දිනැති සටහන්, මානව සම්පත් නිලධාරී මජීඩ් මොහොමඩ් සමීල් මහතා, 19-20 පිටු- වැඩිදුර හරස් ප්‍රශ්න

පි. මේ ආයතනයෙන් තීරණයක් ගත්තාම අපි දැනුම් දීලා මේ වගේ සිස්ටම් එකේ අප්ඩේට් කරන්න අවුරුදු 2ක් 3ක් යනවා සාමාන්‍යයෙන් අපි විටින් විට ඉන්ෆෝම් කරලා තියෙනවා සියලුම අංශවලට 2017 සිට මේක මේ සිස්ටම් එක අප්ඩේට් කරගෙන එන්න කියලා. 2019-2020 වන විට ඒක 95% ම අප්ඩේට් වෙලා තිබුණා.

ප්‍ර: එතකොට මහත්මයා මේ ආර්-21 කියන ලේඛනය 2019 සැප්තැම්බර් ගත්ත ලේඛනයක් නේද?

පි: ඔව්

ප්‍ර: එතකොට මේ ලේඛනය නිවරදි වෙන්න බැහැ නේද?

පි: ආර් -21 ලේඛනය නිවරදි

ප්‍ර: ආර් -21 ලේඛනය නිවරදි කියලා මහත්මයා කියනවානම් ඒකේ තියෙන දත්ත අනුව ජාතික සේවක සංගමයේ නිලධාරියෙක් නිදහස් වීමට සුදුසුකම් ලබන්නේ නැහැ නේද?

පි: සුදුසුකම් ලබන්නේ නැහැ ස්වාමීනි

ප්‍ර. එතකොට මේ ආර් - 15 ලේඛනයෙන් උපදෙසකුත් දීලා තියෙනවා 2019.12.31 දිනට පෙර මේ යාවත්කාලීන කිරීම කරන්න කියලා?

පි: ඔව්

ප්‍ර. එනකොට එහෙම කියලා තිබියදී යාවත්කාලීන නොකරනලද ලේඛනයක් තමයි මහත්මයා ආර්-21 කියලා මේ අධිකරණයට ඉදිරිපත් කරලා තියෙන්නේ?

පි: ඔව්

ප්‍ර: එහි සඳහන් දත්ත පදනම්ව තමයි මහත්මයා මේ දැන් සාක්ෂි දෙන්නෙත් නේද සාමාජික සංඛ්‍යාව සම්බන්ධයෙන්?

පි: ඔව්

අනෙක් අතට, අවකරණ ලේඛන මගින් ඒ ඒ සේවකයාගේ වැටුපෙන් සාමාජික මුදල් බැර වන්නේ කිනම් වෘත්තීය සමිතියේ මුදල් ගිණුමටද යන්න පැහැදිලිව අවබෝධ කරගැනීමට හැකි නිසාවෙන් එක් එක් වෘත්තීය සමිති සාමාජිකයන් ගණන එමගින් තීරණය කිරීමේ හැකියාවත් පැවතියදී, දෙවන පාර්ශ්විය සාක්ෂිකරු ඒ පිළිබඳ කිසිදු අවබෝධයක් නොමැති බව හඟවමින් තමන් ඉදිරිපත්කළ දත්ත තහවුරු කිරීමට උත්සාහ කර ඇත. කෙසේ නමුත්, ඔහු අවකරණ ලේඛන මත සාමාජිකයන් ගණන ලැයිස්තු ගත කළේ නම් R21 සංඛ්‍යා ලේඛනයට වඩා සාක්ෂිමය වටිනාකමක් තිබෙනු ඇත. සාක්ෂිකරුගේ විශේෂඥතාව තිබියදී එවැනි මූලික ලේඛනයක් පිළිබඳ අනවබෝධයෙන් හෝ සිතාමතා එකී ලේඛනයේ නිරවද්‍යතාව මඟහැරීමට R21 ලේඛනයේ දත්ත ඉදිරිපත් කළේද යන්න ගැටළුවකි.

2023.10.16 වන දිනැති සටහන්, මානව සම්පත් නිලධාරී මජීඩ් මොහොමඩ් සමීල් මහතා, 22 පිටුව - හරස් ප්‍රශ්න

ප්‍ර: මම මහත්තයාට යෝජනා කරනවා එවැනි ලේඛනයක් යවනවා නම් මේ මහත්මයා අද ඉදිරිපත් කරලා තිබෙන R21 ලේඛනය මහත්තයා හුදෙක්ම මේ ගරු අධිකරණයට ඉදිරිපත් කරගෙන සකස් කරගෙන ආපු ලේඛනයක් මිස ආයතනයේ මේ කියන කාරණාව තහවුරු වන පිලිගත් ලේඛනයක් නොමෙයි කියලා?

පි: මම එක පිළිගන්නේ නැහැ. ඒක මමමයි මේවා කළේ. ඒ දවස්වල ඉඳන්ම මම මේ කටයුතු කරනවා. මේක ක්‍රියාත්මක වුණ හේතුව මේක විතරක් නෙවෙයි ගොඩක් හේතු තිබ්බා.

ඇ. දෙවන පාර්ශ්වය අපකීර්තියට පත්වන අයුරින් කටයුතු කිරීම

පළමු පාර්ශ්වය විසින් දෙවන පාර්ශ්වය අපකීර්තියට පත්වන අයුරින් කටයුතු කළ බව ස්ථාවරය කොටගත්තද, සාක්ෂි මගින් එවැන්නක් කිසිම විටක ඔප්පු කර නොමැත. ලං. වි. ම. අපකීර්තියට පත්වන අයුරින් ප්‍රකාශයට පත්කරන ලද මුද්‍රිත හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය කිසිදු සාක්ෂියක් දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත්කර නොමැත. කෙසේ නමුත් පළමු පාර්ශ්වය විසින් ගොනුකළ CA/WRIT/193/15 දරන නඩුවේ තීන්දුව (A7) 2019.04.02 වනදින ප්‍රකාශයට පත් කරමින් සර්ෂියෝරාරි රිට් ආඥාවක් නිකුත් කිරීමත් සමග ඉහළ නිලධාරීන්හට සිදුවූ අහිතකර බලපෑම ඔස්සේ පළමු පාර්ශ්වය ඔවුන් අපකීර්තියට ලක්කළ බැව් සඳහන් කරන්නට ඇතැයි A18 දරන 2019.10.09 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ 2 පිටුවේ අන්තර්ගතය කියවීමේදී පෙනී යයි.

2013.07.17 වන දිනැති සටහන්, මානව සම්පත් නිලධාරී මජීඩ් මොහොමඩ් සමීල් මහතා, 23 පිටුව - මුලිත සාක්ෂි

ප්‍ර: මෙම නඩුවේ ඉල්ලුම්කරු සාමාජිකත්වය දරන ලංකා විදුලි පොදු සේවක සංගමයේ සාමාජිකත්වයට අමතරව මෙම නඩුවේ ඉල්ලුම්කරුවන් නිදහස් කිරීම සම්බන්ධයෙන් තවත් ගැටළුවක් තිබුණාද?

පි: මම දන්න තරමින් ගැටළුවක් තිබුණා.

ප්‍ර: කුමක්ද එම ගැටළුව ?

පි: එම වෘත්තීය සමිති යම්කිසි මාධ්‍යකින් මණ්ඩලයට අපකීර්ති වන විදියට ප්‍රවෘත්ති යනවා කියලා ගැටළුවක් තිබුණා...

ප්‍ර: ඔහුව නිදහස් නොකරන්න වෙනත් ආකාරයක ප්‍රශ්නයක් තිබුණාද මණ්ඩලයට?

පි: මට මතක විදියට එවැනි ප්‍රශ්නයක් තිබුණේ නැහැ.

පළමු පාර්ශ්වයට අනුව නිදහස් නොකිරීමට හේතුවූ කරුණු

අ. පළිගැනීමේ චේතනාව

2015 වර්ෂයේදී දෙවන පාර්ශ්ව විසින් නීති විරෝධී ලෙස ඉංජිනේරු සේවාවට වෙනම වැටුප් තලයක් හා වැටුප් වැඩිකර ගැනීමක් සිදුකරගෙන ඇති අතර, එයට එරෙහිව පළමු පාර්ශ්වය විසින් 2015 වර්ෂයේදී CA/WRIT/193/15 දරන නඩුව අභියාචනාධිකරණයේදී ගොනු කරනලදී. එහි නඩු තීන්දුව (A7) 2019.04.02 වන දින ප්‍රකාශයට පත් කරමින් එකී වැටුප් තලය ශුන්‍ය හා බලරහිත කරමින් සර්ෂියෝරාරි රිට් ආඥාවක් නිකුත්කර ඇත. කෙසේ වෙතත්, එකී තීන්දුව ක්‍රියාත්මක කිරීම පැහැර හැරීම හේතුවෙන් පළමු පාර්ශ්වය සහ ඉල්ලුම්කරු පෙත්සම්කරුවන් වශයෙන් දෙවන පාර්ශ්වයට එරෙහිව CA/COC/011/2019 දරන අධිකරණයට අපහාස කිරීමේ නඩුව ගොනුකර ඇත. ඉහත කී කරුණු දෙවන පාර්ශ්වයේ අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුව බලපාන බැවින් පලිගැනීමේ චේතනාන්විතව මෙම ඉල්ලූම්කරුව පූර්ණ කාලීනව නිදහස් නොකිරීමට හේතු විය හැකි බව පළමු පාර්ශ්වයේ ස්ථාවරය වේ.

මෙකී කාලය වනවිට පළමු පාර්ශ්විය ලේකම් විසින් 2019.07.23 දිනැති ලිපිය මගින් 2019.08.15 සිට 2020.08.14 දක්වා ඉල්ලුම්කරු පස්වන වසර සඳහා පූර්ණකාලීනව නිදහස් කරන ලෙස දෙවන පාර්ශ්වයට ඉල්ලීම්කර ඇති අතර, මාස 2කට පමණ පසු පිළිතුරු දෙමින් 2019.09.24 දිනැති ලිපිය මගින් එකී ඉල්ලීම බැහැර කරමින් වෙනත් අයකු යෝජනා කරන ලෙස දන්වා ඇත.

දෙවන පාර්ශ්වයේ එකී හැසිරීම තහවුරු වන අනෙක් කරුණ නම් දෙවන පාර්ශ්වය විසින් තම දෙවන ප්‍රකාශයේ 13 වන සම්ප්‍රකාශය මගින් පළමු පාර්ශ්විය ඉල්ලුම්කරු ආයතනයට කැළලක් වන ලෙස සහ සේවකයන්ගේ කීර්තියට හානි ලෙස කටයුතු කරන බවට වෙනත් වෘත්තීය සංගම් විසින් ලිපි ඉදිරිපත්කර ඇති බවත්, ඉල්ලුම්කරු පූර්ණ කාලීන වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කිරීමේ තීරණය යළි සලකා බලන ලෙසට ඉල්ලීම් කර ඇති බවත්, එම වෘත්තීය සමිතියේම සාමාජිකයන් පිරිසක්ද ඉල්ලූම්කරුගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් ගැටළු පවතින බවට ලං.වි.ම. සාමාන්‍යාධිකාරී වෙත පැමිණිල්ලක් යොමුකර ඇති බවත් සඳහන්කර තිබීම සහ ඒ සම්බන්ධව කිසිදු ලිඛිත සාක්ෂියක් ඉදිරිපත්කර නොතිබීමය.

A18 දරණ 2019.10.09 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ 2 පිටුවේ අන්තර්ගතය කියවීමේදී ඉල්ලුම්කරු සම්බන්ධයෙන් වෛරී චිත්‍රයක් පෙන්නුම් කරන ආකාරය දක්නට ලැබෙන අතර, ඊට පාදක කරගෙන ඇත්තේද ඉල්ලුම්කරු සහ පළමු පාර්ශ්වය විසින් පවරන ලද නඩුවේ තීන්දුව බවට පැහැදිලිය. *"He has been an anarchist throughout his release period... He has mastermined the court case no.CA/WRIT/193/2015 and as a result of the court decision salaries paid to some CEB employees had to be suspended for the months of April, May and June... Further he has filed contempt of court case no CA/COC/11/2019 against the CEB board and General Manager pleading punishments"*

1999 අංක 56 දරණ කාර්මික ආරාවුල් (සංශෝධිත) පනත

324 වගන්තිය

කිසිම සේවා යෝජකයෙකු විසින් යම් කම්කරුවෙකු හෝ වෘත්තීය සමිතියක නිලධාරියකු (i) කම්කරුවා හෝ නිලධාරියා විසින් යම් විනිශ්චයාධිකාරියක් හෝ බලධාරයකු ඉදිරියෙහි සද්භාවයෙන් කරනලද යම් ප්‍රකාශයක් සම්බන්ධයෙන් (ii) ඒ වෘත්තීය සමිතියේ සාමාජිකයන්ට සහන ලබා ගැනීමේ හෝ ඔවුන්ගේ වැඩ කිරීමේ තත්වයන් යහපත් බවට පත්කර ගැනීමේ කාර්යය සඳහා කාර්මික ආරාවුලක් අනුව ඒ කම්කරුවා හෝ නිලධාරියා විසින් ඒ වෘත්තීය සමිතියේ සාමාජිකයින්ගේ සේවා නියුක්තියේ නියමයන්ට හෝ කොන්දේසි වලට අදාළව සේවා යෝජකයාගේ ක්‍රියා නොකර හැරීමේ පිළිබඳව කරන ලද යම් ප්‍රකාශයන් සම්බන්ධයෙන් ඒ කම්කරුවා හෝ සමාජිකයා සේවයෙන් පහ කිරීම හෝ ඔහුට විරුද්ධව අන්‍යාකාරයකින් විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගැනීම නොකළ යුතුය.

ඒ අනුව. අධිකරණය දෙවන පාර්ශ්වය විසින් බලය අවභාවිතකර අසාධාරණ හා අත්තනෝමතිකව ගත් තීරණයක් බවට තහවුරු කරගත් පසුව ලබාදුන් තීන්දුවක් තිබියදී එකී CA/WRIT/193/15 නඩුව ගොනු කිරීම මත දෙවන පාර්ශ්වයට ඉල්ලුම්කරුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත නොහැකි සේම, වෛරී සහගත තීන්දු තීරණ වලට එළඹිය නොහැක.

2023. 03. 27 වන දිනැති සටහන්, පී.ඩී.යූ. මාලක වික්‍රමසිංහ මහතා, 18 පිටුව - නැවත ප්‍රශ්න

ප්‍ර: හරස් ප්‍රස්නවලට උත්තර දෙමින් මහත්මයා කිව්වා සංගමයේ ලේකම්වරයා නිදහස් කළේත් නැහැ පූර්ණකාලීනව දෙවන අවුරුද්ද සඳහා?
පි: එහෙමයි
ප්‍ර: ඒ සම්බන්ධව මහත්මයාට මොකක්ද කියන්න තිබෙන්නේ?
පි: මණ්ඩලය විසින් පොදු සේවක සංගමය ඉලක්ක කරගෙන මම පමණක් නෙවෙයි. පොදු සේවක සංගමය ඉලක්ක කරගෙන එක පැත්තකින් ලේකම්වරයා නිදහස් නොකිරීම. ඊට අමතරව මේ වෙන කොටත් සමාජ මාධ්‍ය දූරාචාරය කියලා අපේ විධායක සභාවේ 10ක් සම්බන්ධයෙන් විනය පරික්ෂණයක් යනවා. යම් සියලු දේ අපි පැහැදිළිව කියන්නේ පොදු සේවක සංගමය ඉලක්ක කරගෙන කරන පැලිගැනීම් සහ වෘත්තීය සමිති මර්දන කියන දේ තමයි මේ සෑම දෙයින්ම පැහැදිලි වන්නේ

<u>ආ. දෙවන පාර්ශ්වයේ අනෙක් වෘත්තීය සංගම් අතර පළමු පාර්ශ්වය වෙනස් කොට සැලකීම</u>

**දෙවන පාර්ශ්වය ඇතුළත ක්‍රියාකාරී වෘත්තීය සමාගම් 49ක් පමණ සිටින බවත් ඉන් 4ක් සඳහා පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතුවල යෙදීමට නිලධාරීන් මුදාහැර ඇති බවත් දෙවන පාර්ශ්වයේ සාක්ෂිකරු විසින් ප්‍රකාශ කර ඇත.**

A12 සහ A15 දරන ලිපිවල අන්තර්ගතය දෙවන පාර්ශ්වය විසින් ප්‍රශ්නකර නොමැති හෙයින් එහි සඳහන් පහත කාරණා වෙත අවධානය යොමු කරමි. එහි මීට පෙර අවස්ථාවලදී පස්වන වර්ෂය සඳහා නිලධාරින් පූර්ණ කාලීනව නිදහස්කර ඇති අවස්ථා 3ක් සඳහන් වේ. ඒ අනුව, ජාතික සේවක සංගමය වෙනුවෙන් ජී. වීරසේකර මහතා, විදුලි සේවක සංගමය වෙනුවෙන් ආර්.පී.අයි.යූ.විජේවික්‍රම මහතා සහ විදුලි සේවක සංගමය වෙනුවෙන් රන්ජන් ජයලාල් මහතාද පස්වන වර්ෂය සඳහා පූර්ණ කාලීනව නිදහස් කර ඇත.

2023.12.15 වන දිනැති සටහන් මානව සම්පත් නිලධාරි මජීඩ් මොහොමඩ් සමීල් මහතා 9-10 පිටු - හරස් ප්‍රශ්න

ප්‍ර: ඔය මහතා කියපු විදුලි සේවක සංගමයේ පූර්ණ කාලීනව නිදහස් වෙලා හිටියේ එක්කෙනයි ද දෙන්නයිද?
පි: දෙන්නයි
ප්‍ර: ඒ කවුද?
පි: රංජන් ජයලාල් කියන ඒ සමිතියේ ලේකම් සහ අනෙක් සාමාජිකයා ඉන්දික විජේවික්‍රම කියලා
ප්‍ර: එතකොට මහත්තයා ඔය රංජන් ජයලාල් කියලා නමක් කියුවා නේද?
පි: ඔව්
ප්‍ර : ඒ මහත්තයා මේ 2019 වන විට වසර කීයක් නිදහස් වෙලා හිටිය වෘත්තීය සමිති නායකයෙක්ද?
පි: මට මතක හැටියට ඒ වෙලාවේදී අවුරුදු 10 ක් පමණ වෘත්තීය සමිති සඳහා පූර්ණ කාලීනව නිදහස් වෙලා හිටියා
ප්‍ර: අඛණ්ඩව නිදහස් වෙලා හිටියා නේද?
පි: ඔව්
ප්‍ර: එතකොට මේ මාලක වික්‍රමසිංහ මහත්තයාගේ නිදහස් වීම ඉල්ලපු වසරේම රංජන් ජයලාල් මහත්තයාත් ඔහුගේ ඊලඟ කුමක් හෝ වසරක් දීර්ඝ කිරීමක් සඳහා ඉල්ලීමක් කළාද?
පි: කරලා තියෙනවා
ප්‍ර: ඒකට මොකක්ද කළේ?
පි: එතුමාගේ ඉල්ලීම මාලක වික්‍රමසිංහ මහත්තයගේ කාලපථය දෙකම වෙනස් ස්වාමීනි එතුමාගේ ඉල්ලීම ඇවිල්ලා තිබුණේ මාර්තු සහ අප්‍රේල් මාසවල

පි. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබුණා
ප්‍ර. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබෙනකොට ඔබ ඒ වෙනකොට රංජන් ජයලාල් මහත්තයා 10 වන අවුරුද්දට තමයි නිදහස් වෙන්නේ ඔබට මතක හැටියට?
පි: ඔව්

ඉල්ලුම්කරු මුදා නොහැරීම හෙළා දකිමින් දෙවන පාර්ශ්වයේ වෘත්තීය සමිති කිහිපයක අත්සනින් යුතුව විෂයභාර අමාත්‍යවරයා වෙත යවන ලද A30 දරණ ලිපිය අනුවද ඉල්ලුම්කරුට වෙනස් කොට සැළකීමක් සිදුකර ඇතිබව ඔප්පු වේ.

කරුණු එසේ හෙයින්, පළමු පාර්ශ්වකාර ඉල්ලුම්කාර පී.ඩී.යූ.මාලක වික්‍රමසිංහ මහතා 2019.08.15 සිට 2020.08.14 දින දක්වා වසරක කාලයකට පූර්ණ කාලීන වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කරන ලෙස පළමු පාර්ශවකාර සංගමය විසින් කරන ලද ඉල්ලීම පාලනාධිකාරිය විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් එකී ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුව ඇති බවට තීරණය කරමි.

02. පළමු පාර්ශ්වකාර ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුවී ඇත්නම් හිමිවිය යුතු සහනයන් කවරේද?
විශේෂයෙන් සඳහන් කළයුතු කරුණක් වන්නේ, පාර්ශ්වයන් විසින් සිය උත්තරවාද මගින් කියාපාන ඉල්ලුම්කරුගේ සේවය අතහැර යාම බේරුම්කරණයට යොමු කරන ලද ආරාවුලේ ඇතුළත් කාරණයක් නොවන බැවින් සහ සේවය අතහැර යාමක් සිදුවූවා හෝ නොවූවා හෝ එසේ සිදුවන්නේ පූර්ණ කාලීනව නිදහස් කිරීමට අදාළ ඉල්ලීම ප්‍රතික්ෂේප වූ පසු ඉල්ලුම්කරුගත් තීරණයක් මත පමණක් බැවින් ඉල්ලුම්කරුට හිමිවිය යුතු සහන මොනවාද යන්න සලකා බැලීමේදී සේවය අතහැර යාම හේතුවෙන් ඉල්ලුම්කරුට වූ අසාධාරණයක් වෙතොත් වන සහන සැලකිල්ලට නොගන්නා බවයි. වැඩිදුරටත්, ඉල්ලුම්කරු සේවය අතහැර යාමක් ලෙස දක්වා දෙවන පාර්ශ්වය විසින් සේවය අත්හිටුවීම සම්බන්ධව වෙනත් අයදුම්පතක් මගින් විසඳා ගත යුතු බවත් ප්‍රකාශ කරමි.

කෙසේ නමුත්, පූර්ණ කාලීනව මුදා නොහැරීමෙන් ඉල්ලුම්කරුට දෙවන පාර්ශ්වයෙන් අසාධාරණයක් වී ඇති හෙයින් දිය හැකි යම් සහන මොනවාදැයි තීරණය කිරීමට ප්‍රථම ඔහුව එම තීරණයේ ඍජු ප්‍රතිඵලයක් ලෙස සිදුවූ හානිය සලකා බැලිය යුතුය. ඉල්ලුම්කරු සේවයෙන් මුදා නොහැරියද ඔහු අදටත් පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා සහභාගි වන බව සාක්ෂි මගින් අනාවරණයට ඇත. නිලවරණ මගින් තේරී පත්ව සභාපති ධූරය අදටත් හොබවමින් වෘත්තීය සමිතිය තුළ කටයුතු කරන හෙයින්, 2019-2020 වර්ෂ සඳහා නිදහස් නොකිරීම මත ඊට අදාළව අද වන විට ප්‍රායෝගිකව ලබාදිය හැකි ප්‍රතිකර්මයක් නොමැති බවට පෙනී යයි.

03. පළමු පාර්ශ්වකාර ඉල්ලුම්කාර පී.ඩී.යූ. මාලක වික්‍රමසිංහ මහතා එපරිද්දෙන් පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් නොකිරීම මත අදාළ පළමු පාර්ශ්වකාර වෘත්තීය සමිතියට අසාධාරණයක් සිදුවී තිබේද?

ඉල්ලුම්කරු වන පී.ඩී.යූ. මාලක වික්‍රමසිංහ මහතා පළමු පාර්ශ්වකාර වෘත්තීය සමිතියේ සභාපති ලෙස 2019- 2020 වර්ෂය සඳහා පූර්ණ කාලීනව නිදහස් නොකරන අතර, එහි ලේකම් වූ කසුන් බොතේජු මහතාද පූර්ණකාලීනව නිදහස් කිරීම 2019.11.16 න් පසු ලබාදී නොමැත. විශාල සාමාජික සංඛ්‍යාවක් සිටියදී 2019-2020 වර්ෂය තුළ සභාපති හෝ ලේකම්ගේ පූර්ණ කාලීන දායකත්වයකින් තොරව වෘත්තීය සමිතියක් පවත්වාගෙන යාහැකිද වන ගැටළුව පවතී. නිලවරණයකින් අඛණ්ඩව යම් නිලධාරියෙක් පත්වන්නේ ඔහුගේ හැකියාව. නිපුණත්වය. පෞරුෂය සහ විශේෂයෙන්ම සාමාජික ගැටළුවලට විසඳුම් අත්කරදිය හැකියාව පැවතීම යන කාරණා සියල්ල හේතුවෙනි. එවැනි පුද්ගලයෙකු පූර්ණකාලීනව නිදහස් නොකිරීම තුළින් වෘත්තීය සමිතියට අසාධාරනයක් මෙන්ම වෘත්තීය සමිති අරමුණු ඉටුකර ගැනීමටද බාධා සිදුවේ. A12 සහ A15 දරන ලිපි මගින්ද පළමු පාර්ශ්වයේ වෘත්තීය සමිති මධ්‍යම කාරක සභාව විසින් ඉල්ලුම්කරුගේ වෘත්තීය සමිති සේවයේ අවශ්‍යතාව තහවුරුකර ඇත. දෙවන පාර්ශ්වය විසින් ඒකී ලේඛනයේ අන්තර්ගතය අභියෝගයට ලක්කර නොමැත.

2023.03.08 වන දිනැති සටහන් පී.ඩී.යූ. මාලක වික්‍රමසිංහ මහතා, 17 පිටුව - වැඩිදුර හරස් ප්‍රශ්න

ප්‍ර : වෘත්තිය සමිතියක මූලික පරමාර්ථය වනනේ තමන්ගේ සේවකයන්ගේ යහපත සම්බන්ධයෙන් කටයුතු කිරීම?
පි: ඔව්
ප්‍ර: ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී නිදහස් කරන්නේ කවුද යන්න කවුරු නිදහස් කලත් ඒ නිදහස් කරන්නේ එම සමිතියේ සුබසාධනය වෙනුවෙන්
පි: නිදහස් කරන්නේ කවුද කියන එක තීරණය කරන්නේ වෘත්තීය සමිතිය විසින්
ප්‍ර: වෘත්තිය සමිතියක පරමාර්ථය වන්නේ තමන් යටතේ ඉන්න සේවනයින්ගේ අයිතිවාසිකම් සේවකයන්ට සුභ සාධනය සැලසීම වැනි ඔවුන්ගේ යහපත වෙනුවෙන් කටයුතු කිරීම.
පි: නැහැ ඊට වඩා පුළුල් වෘත්තිය සමිතියක පරමාර්ථය වන්නේ අයිතිවාසිකම් වරප්‍රසාද වෙනුවෙන් සටන් කිරීම, එතනදි වෘත්තිය සමිතියට අවශ්‍යකෙනා සභාපති කර ගැනීම කියන්නේ වෘත්තිය සමිති අයිතියක්, එම නිලධාරියා නිදහස් කරගැනීමත් වෘත්තිය සමිති අයිතියක්,

කරුණු එසේ හෙයින්, පළමු පාර්ශ්වකාර ඉල්ලුම්කාර පී.ඩී.යූ.මාලක වික්‍රමසිංහ මහතා 2019.08.15 සිට 2020.08.14 දින දක්වා වසරක කාලයකට පූර්ණ කාලීන වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් නොකිරීම හේතුවෙන් එකී වෘත්තීය සමිතියට අසාධාරණයක් සිදුව ඇති බවට තීරණය කරමි.

04. පළමු පාර්ශ්වකාර වෘත්තීය සමිතියට අසාධාරණයක් සිදුවී ඇත්නම් හිමිවිය යුතු සහනයන් කවරේද?

කරුණු එසේ හෙයින්, පළමු පාර්ශ්වකාර ඉල්ලුම්කාර පී.ඩී.යූ.මාලක වික්‍රමසිංහ මහතා 2019.08.15 සිට 2020.08.14 දින දක්වා වසරක කාලයකට පූර්ණ කාලීන වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් නොකිරීම හේතුවෙන් එකී වෘත්තීය සමිතියට අසාධාරණයක් සිදුව ඇතත්, අදවනවිට ඊට ප්‍රතිකර්මයක් නොමැති බවත්, මින්මතු වෘත්තීය සංගම් සඳහා එකම නීතිය වෙනස් කොට නොසැලකිය යුතු බවත් තීරණය කරමි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

**බණ්ඩාර සෙනරත්,**
බේරුම්කරු.

2024 ඔක්තෝබර් මස 07 වැනි දින දීය.

BCG 11-0192

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.